# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report



ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

நில அளவைத் திணைக்களம்

SRI LANKA SURVEY DEPARTMENT

# 2015

# පටුන


පිටුව

**1.0** හැඳින්වීම 1-4
- 1.1 දැක්ම
- 1.2 මෙහෙවර ප්‍රකාශය
- 1.3 අරමුණු
- 1.4 කාර්ය භාරය

**2.0** කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය - ඇමුණුම 10 5

**3.0** මානව සම්පත් කළමනාකරණය 5-10
- 3.1 කාර්ය මණ්ඩලය - ඇමුණුම 01
- 3.2 ස්ථාන මාරුවීම්
- 3.3 ආයතනික කටයුතු - ඇමුණුම 02
- 3.4 මානව සම්පත් සංවර්ධනය - ඇමුණුම 03
- 3.5 තොරතුරු තාක්ෂණය
- 3.6 ඵලදායිතා ප්‍රවර්ධනය
- 3.7 සහතික/ බලපත්‍ර නිකුත් කිරීම

**4.0** මූල්‍ය කළමනාකරණය 10
- 4.1 වැය ඇස්තමේන්තු - ඇමුණුම 04
- 4.2 අත්තිකාරම් "බී" ගිණුම - ඇමුණුම 05
- 4.3 ආදායම් ගිණුම් - ඇමුණුම 06

**5.0** භෞතික සම්පත් කළමනාකරණය 10-14
- 5.1 නිශ්චල හා චංචල සම්පත් සංවර්ධනය - ඇමුණුම 07
- 5.2 උපකරණ අංශය
- 5.3 වාහන හා යන්ත්‍රසූත්‍ර නඩත්තුව
- 5.4 ප්‍රසම්පාදන හා සැපයීම් අංශය

**6.0** සංවර්ධන ක්‍රියාකාරකම් 15-27
- 6.1 ඉඩම් මැනුම්
- 6.2 භූමිතික මැනුම්
- 6.3 සිතියම්කරණය
- 6.4 භූගෝලිය නාම ශාඛාව
- 6.5 ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය
- 6.6 ලේඛණ කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිති අංශය
  - 6.6.1 හිමිකම් පිඹුරු පිටපත් නිකුත් කිරීම
  - 6.6.2 දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මගින් නිකුත් කරන ලද පිඹුරු අනුරේඛන හා රේඛා චිත්‍ර
  - 6.6.3 උසාවි කොමිෂන් මැනුම්
  - 6.6.4 අවසාන ගම් පිඹුරු හා අවසාන භූලක්ෂණාත්මක පිඹුරු
  - 6.6.5 පැරණි ලේඛණ යාවත්කාලීන කිරීම
  - 6.6.6 පැරණි පිඹුරු සංරක්ෂණය
  - 6.6.7 මැනුම් සඳහා අවශ්‍ය විස්තර සැපයීම (එල්96)
  - 6.6.8 ප්‍රතීතන සහතික නිකුත් කිරීම

පිටුව

**7.0** ඉඩම් තොරතුරු පද්ධති / භූගෝලීය තොරතුරු පද්ධති අංශය 27-29
- 7.1 ගුවන් මැනුම්
- 7.2 දූරස්ථ ගෝචර ග්‍රහණ
- 7.3 භූගෝලීය තොරතුරු පද්ධතිය
- 7.4 ඉඩම් තොරතුරු පද්ධතිය

**8.0** මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය 29-30
- 8.1 වසර තුලදී පවත්වන ලද පාඨමාලා
  - 8.1.1 වසර තුලදී පවත්වන ලද නිශ්චිත පාඨමාලා
  - 8.1.2 වෙනත් ආයතන සඳහා පවත්වන ලද පාඨමාලා

**9.0** විභාග අංශය විසින් 2015 වසර තුල පවත්වන ලද විභාග 33-35

**10.0** පර්යේෂණ හා සංවර්ධන අංශය 36-37

**11.0** හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් අංශය 37

**12.0** විගණන කටයුතු 37

**13.0** ප්‍රගති අංශය 38-39
- 13.1 කාර්ය සාධන වාර්තාව
- 13.2 දෛනික තැපැල
- 13.3 චක්‍රලේඛ බෙදා හැරීම
- 13.4 භාෂා පරිවර්තනය
- 13.5 අධ්‍යයන සැසි
- 13.6 අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් අනුමැතිය

**14.0** වෙනත් තොරතුරු 39
- 14.1 ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු
- 14.2 සේවක සුභ සාධනය

**15.0** සමාප්තිය 40

## 2015 වසර සඳහා සර්වේයර් ජනරාල්ගේ කාර්ය සාධන වාර්තාව

## 1.0 හැඳින්වීම

ඉඩම් මැනීම, සිතියම්කරණය, දුරස්ථ ග්‍රහණ තාක්ෂණික ක්‍රම, ගෝලීය ස්ථාපිත පද්ධතිය (GPS), භූ ගෝලීය තොරතුරු පද්ධතිය (GIS), ඉඩම් තොරතුරු පද්ධතිය (LIS), සහ ඡායාරේඛනමිතික කාර්යයන් වැනි ක්ෂේත්‍රයන්හි පුරෝගාමී මැනුම් සහ සිතියම්ගත කිරීමේ ජාතික ආයතනය මිනින්දෝරු දෙපාර්තමේන්තුවයි. තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමඟ එකී ක්ෂේත්‍රයන්, තොරතුරු තාක්ෂණය වඩාත් දායකකරගත් ක්ෂේත්‍රයන් බවට පත්කර ගැනීමට ද දෙපාර්තමේන්තුවට හැකි විය. නොබෝදා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව තුළ පිහිටුවන ලද භූ භූගෝලීය නාම සහ ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය (NSDI- National Spatial Data Infrastructure) නම් වූ අංශය, ඉඩම් සම්බන්ධ තොරතුරු, ඒ හා උනන්දුවක් දක්වන රටෙහි අනෙකුත් සංවිධාන සමඟ සහයෝගයෙන් බෙදා ගැනීම සඳහා විශාල මෙහෙවරක යෙදී සිටී.

දෙපාර්තමේන්තුව විවිධ ආකාරයෙන් රජයේ සංවර්ධන ව්‍යාපෘතිවලට දායකත්වය ලබාදී ඇත. එසේම උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මැනුම් හා සිතියම්කරණ කටයුතු ඉටු කිරීමෙන්ද දෙපාර්තමේන්තුව උපරිම දායකත්වයක් ලබා දී ඇත. අධිවේගී මාර්ග, මාර්ග පුළුල් කිරීම, ගුවන් තොටුපල, වරායවල් ආරම්භ කිරීම, සංචාරක ව්‍යාපෘති, විදුලි බල හා බලශක්ති ව්‍යාපෘති වැනි සංවර්ධන යෝජනාක්‍රම සඳහා මූලික අවශ්‍යතාවයන් වන ඉඩම් මැන පිඹුරු සැකසීම මැනවින් ඉටු කර ඇත.

භූමිතික පාලන ජාලය පිහිටුවීම සහ ගෝලීය ස්ථානීය ක්‍රමය හඳුන්වාදෙමින් එය ඉහල නිරවද්‍යතාවයට උසස් කිරීම, අහලට සැතපුමේ භූලක්ෂණාත්මක සිතියම් මාලාව ප්‍රතිස්ථාපනය කරමින් 1:50,000 භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව සැකසීම, දිවයින සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි 1: 10,000 භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව සැකසීම, භාෂාත්‍රයෙන්ම ජාතික සිතියම් සංග්‍රහය සැකසීම, 1:2,000 පරිමාණයෙන් කොළඹ සහ අවට නගර සිතියම් සැකසීමට අදාල දත්ත ගබඩාවක් පවත්වා ගැනීම, 1:250,000, 1:50,000 සහ 1:10,000 පරිමාණයේ භූ ලක්ෂණාත්මක දෛශික දත්ත ගබඩාවක් සකසා පවත්වා ගැනීම, LiDAR තාක්ෂණය ශ්‍රීලංකාවට හඳුන්වාදීම, වර්ග කි.මී.7800ක් ආවරණය වනසේ ආංකික උන්නතාංශ පද්ධතියක් පිහිටුවීමෙන් ආපදා කළමනාකරණය සඳහා සහාය ලබාදීමද ඉටුකළ සුවිශාල මෙහෙවරවලින්, කිහිපයක් පමණක් වේ.

තවද ඉඩම් හිමිකම් සහතික පත්‍ර ලබාදීම අරමුණු කොට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක බිම්සවිය වැඩ සටහන සඳහා ඉඩම් මැනීම් සිදුකර "කඩඉම් සිතියම්" සකසා දීම මගින් ඒ සඳහා සක්‍රීය ලෙස දායක වෙමින් සිටී.

රජයේ ආයතනවලින් සිදු කරන කාර්යයන්හි ප්‍රතිලාභ මහජනතාවට ලබාදීමේ අටියෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැනුම් කරන ලද පිඹුරු පිටපත් පරිලෝකනය කර අන්තර්ජාලය හරහා මහජනතාවට පහසුවෙන් දැක බලා ගැනීමට හැකිවනු පිණිස එම තොරතුරු අන්තර්ජාලයට එක් කිරීම 2013 වසරේ කොළඹ දිස්ත්‍රික් කාර්යාලයෙන් සකසන ලද පිඹුරු අන්තර් ජාලයට මුදා හැරීමෙන් ආරම්භ කරන ලදී. මෙතෙක් කොළඹ දිස්ත්‍රික්කයට පමණක් සීමා වී තිබූ අන්තර්ජාලයෙන් පිඹුරු විස්තර ලබා ගැනීම බස්නාහිර පළාතම ඇතුලත් වන සේ 2014 වසරේදී ව්‍යාප්ත කළ අතර මේ වසරේදී පුත්තලම් දිස්ත්‍රික්කයේ පිඹුරුද සම්පූර්ණයෙන් ඇතුළත් කරන ලදී.කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිඹුරුද ඇතුළත් කිරීමට සැලසුම් කර ඇත. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ www.survey.gov.lk වෙබ් අඩවියේ Survey Plan Searcher තුලින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද බස්නාහිර පළාතට සහ පුත්තලම් දිස්ත්‍රික්කයට අයත් සියළුම පිඹුරු පරීක්ෂා කල හැක. තවද විහාර දේවාලගම් ඉඩම් අඩංගු හිමිකම් පිඹුරු

පරිලෝකනය කර නිම කර ඇති අතර, එම තොරතුරු අදාල විහාරස්ථානවලට ලබාදීමට කටයුතු කර ඇත.
මහජනතාවට සේවාවන් කඩිනමින් සැපයීම සඳහා අන්තර්ජාලය හරහා සිතියම් හා ආංකික දත්ත මිලදී ගැනීම සඳහා On line Serveying & Mapping Service (e-SAMS) නමින් වෙබ් අඩවියක් නිර්මාණය කර ඇත. මහජනතාවට මෙම වෙබ් අඩවිය මඟින් සිතියම් හා ආංකික දත්ත ඉල්ලුම් කිරීම හා ණයපත් (credit card) මඟින් ගෙවීම් කිරීමට පහසුකම් සලසන අතර, දෙපාර්තමේන්තු කාර්යාලයකට නොපැමිණ එම සේවාවන් ඔවුන්ගේ නිවසටම ලබාදීමට ක්‍රියාවලීන් වැඩිදියුණු කර ඇත.

එසේම උතුරු නැගෙනහිර පළාත්වල ජනතාවට මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටුවන සේවාවන් පහසු වෙන් ලබා ගැනීම සඳහා මෙන්ම සංවර්ධන කටයුතුවලට දායකත්වය දැක්වීම සඳහාත් නව දිස්ත්‍රික් හා ප්‍රාදේශිය කාර්යාල පිහිටුවීමට අවශ්‍ය වූ අතර, කිලිනොච්චිය දිස්ත්‍රික් කාර්යාලය 2012 වසරේත්, මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය සඳහා සකසන ලද නව ගොඩනැගිල්ල 2013 වසරේත්, යාපනය දිස්ත්‍රික් කාර්යාලය හා මුලතිවු දිස්ත්‍රික් කාර්යාල සඳහා සකසන ලද නව ගොඩනැගිලි 2014 වසර තුලදීත් විවෘත කිරීමට හැකි විය. මේ වසරේදී පුත්තලම, ගාල්ල හා ත්‍රිකුණාමලය යන ප්‍රාදේශීය කාර්යාල තුන සහ නිලාවේලි සංචාරක බංගලාව සඳහා ගොඩනැගිලි ඉදිකර විවෘත කිරීමට හැකි විය.

2014 වසරේදී මෙන්ම මේ වසරේදීද මානව සම්පත් සංවර්ධනය සඳහා කටයුතු කර ඇති අතර, මේ වසරේදී දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කර ගැනීමට අවශ්‍ය වාහන 16 ක් සහ ගුවන් ඡායාරූප ගැනීම සඳහා මිනිසුන් රහිත ගුවන් යානයක් (UAV) මිලදී ගැනීමටද කටයුතු කර ඇත.

දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනය වන දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පූර්ණ අධ්‍යාපනික ශක්‍යතාවයන් සපුරා ගැනීමට හැකිවන අයුරින් මැනුම් හා සිතියම්කරණ විෂයයෙහි ලා උසස් ගුණාත්මක අධ්‍යාපනික පලපුරුද්ද ලබාදීමේ මෙහෙවර ඉටු කරනු ලැබ ඇත. මෙම ආයතනයෙන් උපාධි පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා සඳහා නිලධාරීන් පුහුණු කිරීම හා දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන්ට අනුව නිලධාරීන් පුහුණු කිරීම කරනු ලැබේ.මෙම ආයතනය ශ්‍රී ලංකාවට හා විදේශීය අවශ්‍යතාවයන් සඳහා භූමි තොරතුරු තාක්ෂණඥයන් බිහි කරන දකුණු ආසියාවේ දැනුම් කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම සඳහා අවශ්‍ය මූලික සැලසුම් කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.

**දෙපාර්තමේන්තුවේ ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ අරමුණින්, සේවකයන් දිරිගැන්වීම සඳහා ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පවත්වන ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියට ඉදිරිපත් විය. එහිදී දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය විශේෂ කුසලතා සහතිකයක් දිනාගත් අතර මිනින්දෝරු දෙපාර්තමේන්තුව කුසලතා සහතිකයක් හිමි කර ගන්නා ලදී.**

## 1.1දැක්ම

ඉඩම් තොරතුරු සැපයීමේ
සඳා ප්‍රමුඛයා වීම
අපගේ දැක්මයි.

## 1.2 මෙහෙවර

වෘත්තීය නිපුණත්වයෙන් යුත් සේවා ලැදි
පිරිසක් මගින් ගුණාත්මක භූමි තොරතුරු
නිපැයුම් හා සේවාවන් සැපයීම මිනින්දෝරු
දෙපාර්තමේන්තුවේ මෙහෙවරයි.

## 1.3 අරමුණු

කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල සහ දියතලාවේ මැනුම් සහ සිතියම් ගතකිරීමේ ආයතනයෙන් සමන්විත දිවයින පුරා විසිරුණු කාර්යාල ජාලයක් මගින් දෙපාර්තමේන්තුවේ සේවාව පොදු මහජනයා වෙත ලබා දීමට කටයුතු සලසා ඇත. සමාලෝචනයට භාජනය වූ වසර තුළ මෙම කාර්යාලවල ක්‍රියාකාරිත්වය පහත සඳහන් අරමුණු කරා ඉලක්ක කරන ලදී.

- මැනුම් පුහුණු සහ මැනුම් සහ සිතියම්ගත කිරීමේ වාර්ෂික වැඩ සටහන සම්පූර්ණ කිරීම.
- කාර්ය මණ්ඩල පුහුණු කිරීම්.
- වර්ෂය තුල නිම කිරීමට බලාපොරොත්තු වූ වැඩ සටහන් සඳහා අවශ්‍ය වූ නිශ්චල සහ චංචල සම්පත් ගොඩ නගා පවත්වා ගෙන යාම.
- ලබාදෙන ලද රජයේ අරමුදල් වර්ෂය තුල නිම කළ යුතුව තිබූ ඒ ඒ පරමාර්ථයන් සඳහා යෙදවීම.
- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විනය පවත්වා ගෙනයාම සහ සුභ සාධනය පිළිබඳ කටයුතු කිරීම.
- මැනුම් වෘත්තියේ ප්‍රමිතීන් පාලනය හා පවත්වාගෙන යාම.

## 1.4 කාර්යභාරය

- භූමිතික පාලන ජාලයක් ස්ථාපනය කර එය දිවයින පුරා පවත්වා ගෙන යාම.
- සියළු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සඳහා මැනුම් සේවා සැපයීම.
- සිතියම්කරණය සහ සංවර්ධන සැලසුම් සඳහා අවශ්‍ය වන ගුවන් ඡායාරූප සැපයීම.
- ජාතික අවශ්‍යතාවයන් සඳහා භූලක්ෂණාත්මක, තේමා හා විශේෂ කාර්යයන් සඳහා වූ සිතියම් සැකසීම සහ ප්‍රකාශයට පත් කිරීම.
- ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි භූගෝලීය තොරතුරු පද්ධතියක් සැකසීම.
- ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ක්‍රමානුකූලව ඉඩම් තොරතුරු පද්ධතියක් සැකසීම.
- චන්ද්‍රිකා ඡායාරූප පිළිබඳ තාක්ෂණය භාවිතා කර භූගෝලීය / ඉඩම් තොරතුරු ලබා ගැනීම.
- මැනුම් වෘත්තිය සඳහා අවශ්‍ය ප්‍රමිතීන් ක්‍රමවත්ව පවත්වා ගෙන යාම.
- දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- රාජ්‍ය ආයතනයන් සඳහා මැනුම් කටයුතු පිළිබඳ උපදෙස් සේවා සැපයීම.
- දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයට අදාල විභාග පැවැත්වීම.
- ඉඩම් මැනීමට හා සිතියම්කරණයට අදාල කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි පර්යේෂණ පැවැත්වීම.
- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ මැනුම් කටයුතු කිරීමට බලාපොරොත්තු වන ලියාපදිංචි මිනින්දෝරුවන් සඳහා ප්‍රතීතන සහතික නිකුත් කිරීම.

## 2.0 කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය

සර්වේයර් ජනරාල් දෙපාර්තමේන්තු ප්‍රධානියා වශයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්යසාධන මට්ටම් පවත්වා ගෙන යාමට වග කියන අතර ඒ සඳහා විවිධ මට්ටම් වල නිලධාරීන් වෙත තම බලතල පවරා ඇත. (*කරුණාකර ඇමුණුම 10* බලන්න)

## 3.0 මානව සම්පත් කළමනාකරණය

2015 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවට පහත සඳහන් පරිදි නිලධාරීන් බඳවා ගෙන ඇත.

| තනතුර | බඳවාගත් නිලධාරීන් ගණන |
|---|---|
| වඩු කාර්මික | 01 |
| මැනුම් ක්ෂේත්‍ර සහායක | 532 |
| නීති නිලධාරී | 01 |
| මැනුම් උපකරණ කාර්මික ශිල්පී | 01 |

## 3.1 කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සම්පූර්ණ තොරතුරු ඇමුණුම 01 හි දක්වා ඇත. දෙපාර්තමේන්තුව තුළ වූ විවිධ සේවාවල, අනුමත සේවක සංඛ්‍යාව පසුගිය වසර වලදී මෙන්ම සමාලෝචිත වසර තුලදී ද හිඟව පැවතුනි. එහෙත් සැලසුම් කරන ලද කාර්යයන් මෙන්ම රජයේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීමේ හේතුවෙන් ඇති වූ ඉතා හදිසි හා අතිරේක කාර්යයන් ද දුෂ්කරතා මධ්‍යයේ වුවද සපුරා ගන්නා ලදී. ( *කරුණාකර ඇමුණුම 01 බලන්න*)

## 3.2 ස්ථාන මාරුවීම්

දෙපාර්තමේන්තු සේවාවලට අයත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්, පළාත් සර්වේයර් ජනරාල්වරුන්, නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීන්, මිනින්දෝරු අධිකාරීන්, රජයේ මිනින්දෝරුවරුන්, කාර්මික හා පරිපාලන නිලධාරීන්, සිතියම් තාක්ෂණ නිලධාරීන්, මැනුම් ක්ෂේත්‍ර සහායකයින් සහ දෙපාර්තමේන්තු කම්කරුවන්ගේ වාර්ෂික ස්ථාන මාරු නියමිත ක්‍රියාපටිපාටියට අනුකූලව සිදුකරන ලද අතර, ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු දෙපාර්තමේන්තුව තුළ හා ඒකාබද්ධ සේවා ස්ථාන මාරු නියෝගද අනුව ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, සිතියම් තාක්ෂණ නිලධාරීන් 20ක් ද, නීති සහකාර නිලධාරියෙකුද, ගණකාධිකාරීවරයෙකුද, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 34ක්ද, සංවර්ධන නිලධාරීන් 07ක් ද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරියෙකු ද, ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් 11 ක් හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන් 7ක් ද දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු වී ගිය අතර, වඩු කාර්මිකවරයෙකුද, සහකාර අධ්‍යක්ෂ (පාලන)වරයෙකුද, ගණකාධිකාරීවරුන් දෙදෙනෙකුද, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 60ක් ද, සංවර්ධන නිලධාරීන් 04ක් ද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් 04ක් ද, ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරීන් 14 ක් හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන් 21ක් ද දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී පැමිණියහ.

## 3.3 ආයතනික කටයුතු

බොහොමයක් සේවාවල නියමිත සේවක සංඛ්‍යාව සමාලෝචනයට භාජනය වූ වසර තුල නොසිටියත්, සැලසුම්කරන ලද ඉලක්කයන් සාර්ථකව නිම කිරීම සඳහා අවශ්‍ය වූ ක්‍රියාකාරකම් සපුරා ඇත. (*කරුණාකර ඇමුණුම 02 බලන්න*)

## 3.4 මානව සම්පත් සංවර්ධනය

*විදේශ* පුහුණුවීම් සඳහා ලද අවස්ථා 28න් අවස්ථා 27ක් ම ඉතා කෙටිකාලීන අවස්ථා විය. එසේම දේශීය වශයෙන් පුහුණුවීම් අවස්ථා 35ක් සඳහා නිලධාරීන් 183ක් ද, දිගු කාලීන පුහුණුවීම් අවස්ථා 3ක් සඳහා නිලධාරීන් 03 ක් ද සහභාගි කරවන ලදී. සියළුම කණ්ඩායම්වල නිලධාරීන් 25ක් පැය 150 ක දෙමළ භාෂා පුහුණු වැඩසටහනකට සහභාගී කරවන ලදී. තොරතුරු තාක්ෂණය සඳහා එක් නිලධාරිනියකට SLIDA ආයතනයේ පුහුණුව ලබා දෙන ලදී. (*විස්තර සඳහා කරුණාකර ඇමුණුම 03 බලන්න*)

මෙම වැඩ සටහන් නවීන තාක්ෂණය හා අදාල වෙනත් ක්ෂේත්‍රයන් ගැන ඇති දැනුම වැඩි දියුණු කර ගැනීමටත් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයටත් ප්‍රයෝජනවත් විය.

## 3.5 තොරතුරු තාක්ෂණය

පරිපාලන කටයුතුවලට සහායක සේවාවක් ලෙස මානව සම්පත් කළමනාකරණය, දත්ත ගබඩා කිරීම, තොරතුරු ඉක්මනින් හා ක්‍රමවත්ව ලබා ගැනිම සඳහා තොරතුරු තාක්ෂණය නිරන්තරයෙන් යොදාගන්නා ලද අතර අන්තර්ජාල සම්බන්ධතා හා විද්‍යුත් තැපැල වැනි දියුණු සන්නිවේදන ක්‍රම මේ සඳහා යොදා ගෙන ඇත.

**<u>ප්‍රගතිය නිරීක්ෂණ පද්ධතිය (Progress Monitoring System)</u>**

දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉක්මනින් ක්‍රමවත්ව ලබා ගැනීම සඳහා ප්‍රගතිය නිරීක්ෂණ පද්ධතිය (Progress Monitoring System) හඳුන්වා දුන් අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා අන්තර්ජාලයට එක් කර ඇත. මෙම දත්ත පද්ධතිය දෙපාර්තමේන්තු වෙබ් පිටුවෙහි Pro – MS ලෙස ඇතුලත් කර ඇති අතර එම දත්ත පද්ධතිය පිළිබඳ විස්තර පහතින් දක්වනු ලැබේ.

**<u>වාහන පිළිබඳ දත්ත පද්ධතිය (Vehicle Info)</u>**

දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යාල හා අංශ වලට අනුයුක්ත වාහන පිළිබඳ මූලික විස්තර ඇතුලත් කර ඇත. සෑම මාසයක් අවසානයේදී වාහන පිළිබඳ මාසික සාරාංශයට අදාල තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම සඳහා සියළුම පලාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා සර්වේයර් ජනරාල් කාර්යාලයේ ප්‍රවාහන අංශයට පහසුකම් සලසා දී ඇති අතර මෙම දත්ත පද්ධතියේ ඇති පහසුකම් පහත දැක්වේ.

i. මාසික වාර්තා, සමුච්චිත වාර්තා හා අනතුරු පිළිබඳ විස්තර ලබා ගැනීමට හැකි වීම.
ii. දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම වාහන පිළිබඳ වාර්තා හා කාර්තු වාර්තා ලබා ගත හැකි වීම.
iii. දත්ත පද්ධතිය මාසිකව යාවත්කාලීන කර නොමැති වාහන පිළිබඳ වාර්තාවක් ඉහළ පරිපාලනයට ලබා ගත හැකි වීම.
iv. වාහන අංකය, කාර්යාලය හෝ දිස්ත්‍රික්කය අනුව වාහන පිළිබඳ සෙවීම් කල හැකි වීම.
v. වාහන අනතුරු පිළිබඳ විස්තර

**<u>මහජන අනුරේඛන නිකුත් කිරීම් හා පිඹුරු පිටපත් නිකුත් කිරීම පිළිබඳ දත්ත පද්ධතිය (Issue Diagrams)</u>**

සියළුම දිස්ත්‍රික් කාර්යාල වලින් නිකුත් කරන මහජන අනුරේඛන හා පිඹුරු පිටපත් පිළිබඳ තොරතුරු මෙම දත්ත පද්ධතියෙන් ලබා ගත හැක. මෙමඟින් යම් දිස්ත්‍රික්කයක මාසික වාර්තා, සමුච්චිත වාර්තා, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මනින ලද ඉඩම් සඳහා රේඛා චිත්‍ර නිකුත් කිරීමට අදාල වාර්තාවන් හාමුළු දිවයිනටම අදාල මහජන අනුරේඛන හා පිඹුරු පිටපත් නිකුත් කිරීම් පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.

## උපකරණ සේවා කිරීම පිළිබඳ දත්ත පද්ධතිය (Instrument Service Info)

සර්වේයර් ජනරාල් කාර්යාලයේ උපකරණ අංශයට සේවා කිරීම සඳහා භාරගනු ලබන උපකරණ හා උපාංග වල තොරතුරු හා සේවා කිරීම් පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳ දත්ත ඇතුලත් කිරීමට පහසුකම් සලසා ඇත. මෙමගින් ඉහල පරිපාලනයට හා උපකරණ භාර නිලධාරීන්ට උපකරණයේ සේවාවන් පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳ දැනුවත් වීමට පහසුකම් සලසා ඇත.

## මැනුම් ඉල්ලීම් කළමනාකරණ දත්ත පද්ධතිය (SRIMS)

දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වූ මැනුම් ඉල්ලීම් කළමනාකරණ දත්ත පද්ධතිය (SRIMS) නවීකරණය කර අන්තර්ජාලයට එක්කර ඇති අතර ක්ෂේත්‍රයේ සියළුම කාර්යාලයන්හි නිලධාරීන්ට මෙම දත්ත පද්ධතිය භාවිතා කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීමට සියළුම පලාත් ආවරණය වන පරිදි පළාත් මට්ටමින් වැඩමුළු පවත්වන ලදී. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීන් නිකුත් කරන ලද සෑම මැනුම් ඉල්ලීමක්ම පටන් ගැන්මේ සිට අවසානය දක්වා වන ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමට කටයුතු සලසා ඇත. මැනුම් ඉල්ලීමේ අංකය හා වර්ගය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය, ව්‍යාපෘතිය, මිනින්දෝරුවරයාගේ නම හෝ මැනුම් ඉල්ලීම් කරන ලද ආයතනය අනුව මැනුම් ඉල්ලීමේ වර්තමාන තත්ත්වය ගැන සෙවීම් කළ හැක. නිමකරන ලද, ක්‍රියා කෙරෙමින් පවතින හා ක්‍රියාකිරීමට තිබෙන මැනුම් ඉල්ලීම් වලට අදාල සියළුම ප්‍රගති වාර්තා හා මිනින්දෝරුවරුන්ගේ ප්‍රගතියද මෙම දත්ත පද්ධතිය භාවිතයෙන් ලබා ගැනීමටද පහසුකම් සලසා ඇත. එමඟින් ඉහල කළමනාකාරිත්වයට දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබදව එසැනින් දැනුවත් වීමට අවස්ථාව සැලසේ. මෙම දත්ත පද්ධතිය දෙපාර්තමේන්තු වෙබ් පිටුවෙහි SRIMS ලෙස ඇතුලත් කර ඇත.

සියළුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීන්ගේ මැනුම් ඉල්ලීම් නිකුත් කිරීම මෙම දත්ත පද්ධතිය මඟින් සිදු කළ යුතු අතර මිනින්දෝරු අධිකාරීන් හා රජයේ මිනින්දෝරුවරුන් ගේ මැනුම් ඉල්ලීමෙහි වර්තමාන තත්ත්වය යාවත්කාලීන කල යුතුය. මෙමඟින් පහත සඳහන් පහසුකම් සලසා ඇත.

i. සෑම දිස්ත්‍රික්කයකම නිමකරන ලද ව්‍යවස්ථාපිත මැනුම් විස්තර ලැබීම්වලට අදාල ආංකික දත්ත මෙම දත්ත පද්ධතිය මධ්‍යම දත්ත ගබඩාවක (Central Database) ගබඩා කිරීමට පහසුකම් සලසා ඇති අතර එමඟින් ඉඩම් තොරතුරු දත්ත පද්ධති අංශයට අවශ්‍ය ආංකික දත්ත බාගත කර ගත හැක.

i. එමෙන්ම සෑම මසකම ඉඩම් තොරතුරු දත්ත පද්ධති අංශයට එවිය යුතු මැනුම් ඉල්ලීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමටද පහසුකම් සලසා ඇත.

ii. ආංකික දත්ත වල දෝෂ සහගත තත්ත්වයන් තිබේනම් එය දිස්ත්‍රික් කාර්යාල වලට දැනුම් දීමට මෙම පද්ධති මඟින් සිදු කල හැක.

iii. බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදු කරන කැඩැස්තර දැනුම්දීම් වලට අදාල ආංකික දත්තද මෙම දත්ත පද්ධති මඟින් ඉඩම් තොරතුරු දත්ත පද්ධති අංශයට එවීමට පහසුකම් සලසා ඇත. එමෙන්ම සියළුම දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයන් වලට මධ්‍යම දත්ත ගබඩාවට එවන ලද ආංකික දත්ත බාගත කිරීමටද පහසුකම් සලසා ඇත.

iv. මැනුම් ඉල්ලීම් පිළිබඳ දත්ත පද්ධතියෙන් (SRIMS)ඉඩම් තොරතුරු දත්ත පද්ධති අංශයට ලැබෙන ආංකික දත්ත ඉඩම් තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම දක්වා වන ක්‍රියාවලින් නිරීක්ෂණය කිරීම සඳහා හා අදාල ප්‍රගති වාර්තා ලබා ගැනීමට හැකි වන සේ SRIMS දත්ත පද්ධතිය නවීකරණය කර ඇත.

## අන්තර්ජාලය තුළින් මැනුම් හා සිතියම් ආශ්‍රිත සේවාවන් ලබා දීම (e- SAMS)

මහජනතාවට සේවාවන් කඩිනමින් සැපයීම අරමුණින් අන්තර්ජාලය හරහා ඍජුවම සම්බන්ධව සිතියම් හා ආංකික දත්ත මිලදී ගැනීම සඳහා Online Surveying & Mapping Service (e- SAMS) නමින් වෙබ්

අඩවියක් නිර්මාණය කර ඇත. මහජනතාවට මෙම වෙබ් අඩවිය මගින් සිතියම් හා ආංකික දත්ත ඉල්ලුම් කිරීම හා ණයපත් (Credit Card) මගින් ගෙවීම් කිරීමට පහසුකම් සලසන අතර දෙපාර්තමේන්තු කාර්යාලයකට නොපැමිණ එම සේවාවන් ඔවුන්ගේ නිවසටම ලබා දීම දක්වාම ක්‍රියාවලීන් වැඩි දියුණු කර ඇත.

**<u>මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය ( HuRIMS)</u>**

දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය නවීකරණය කර අන්තර්ජාලයට එක්කර සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. මෙතෙක් ලබා දුන් පහසුකම් වලට අමතරව මෙම වර්ෂයේදී සෑම පලාතකම සේවය කරන එක් එක් සේවාවන්ට අදාල නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීමට සහ සෑම කාර්යාලයකම හා අංශයකම සිටින එක් එක් තනතුරට අදාල නිලධාරීන්ගේ සංඛ්‍යාව සෙවිය හැකි ආකාරයට නවීකරණය කරන ලදී. අවශ්‍යතාවය අනුව දත්ත පද්ධති යාවත්කාලීන කිරීම තොරතුරු තාක්ෂණ අංශයෙන් හා අදාල පෞද්ගලික ලිපිගොනු භාර අංශයන් විසින් සිදු කරනු ලැබේ.

**<u>භූමිතික අංශය සදහා තොරතුරු කළමනාකරණ පද්ධතිය Geo – SIMS</u>**

භූමිතික අංශය සදහා තොරතුරු කළමනාකරණ පද්ධතිය Geo – SIMS (Geodetic Survey Information Management System) දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුලින් අන්තර්ජාලයට එක්කර ඇත. මේ වන විට එය සාර්ථකව ක්‍රියාත්මක වන අතර පහත සදහන් පහසුකම් එමගින් ලබා ගත හැක.

i. මැනුම් ඉල්ලීම් කරන ආයතනවලට අන්තර්ජාලය තුලින් මැනුම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හැකිවීම හා එම මැනුම් ඉල්ලීම් සම්බන්ධ ප්‍රගතිය දැනගැනීමේ හැකියාව.
ii. පරිපාලන නිලධාරින්ට මැනුම් ඉල්ලීම් පිළිබඳව ක්ෂේත්‍ර කාර්යාල දැනුවත් කිරීමේ හැකියාව, ප්‍රගතිය දැනගැනීමේ හැකියාව සහ ප්‍රගති වාර්තා ලබා ගැනීම.
iii. ක්‍ෂෙත්‍ර අධීක්ෂණ නිලධාරින්ට තම අදාල ක්‍ෂෙත්‍රයේ ප්‍රගතිය හා වාර්තා පරිපාලන නිලධාරින්ට අන්තර්ජාලය තුලින් ඉදිරිපත් කිරීමේ හැකියාව.

**<u>අන්තර් ජාලයෙන් පිඹුරු විස්තර ලබා ගැනීම - Survey Plan Searcher</u>**

මෙතෙක් බස්නාහිර පළාතට පමණක් සීමාවී තිබූ අන්තර්ජාලයෙන් පිඹුරුවිස්තර ලබාගැනීමට (Survey Plan Searcher) මෙම වසරේදී පුත්තලම දිස්ත්‍රික්කයද ඇතුලත් කල අතර කුරුණෑගල දිස්ත්‍රික්කයේද පිඹුරු ඇතුලත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

## <u>3.6 ඵලදායිතා ප්‍රවර්ධනය</u>

සියළුම ක්‍ෂෙත්‍ර හා කාර්යාල නිලධාරීන් කණ්ඩායම්වල සක්‍රිය දායකත්වය ලබා ගනිමින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම හා ඒ සඳහා සේවක තෘප්තිමත් භාවය වැඩි දියුණු කර වඩාත් ඵලදායීව හා මහජන මිතුරු සේවාවක් ලබා දෙන දෙපාර්තමේන්තුවක් නිර්මාණය කිරීමේ අරමුණින් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ඵලදායිතා වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා නිලධාරීන් දැනුවත් කිරීමේ රැස්වීම් හා ඵලදායිතා කව වල ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරිම සඳහා සර්වේයර් ජනරාල් කාර්යාලයේ අංශයන් හා ඵලදායිතා තත්ත්ව කව අතර තරඟ සංවිධානය කරන ලදී. 2015 වසර සඳහා සුභ පැතුම් පත නිර්මාණය කිරීම, 2014 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ පිටකවරය නිර්මාණය කිරීම, 2016 වර්ෂයේ නව අවුරුදු සුභ පැතුම් පත නිර්මාණය කිරීම හා සර්වේයර් ජනරාල් කාර්යාලයේ ආකර්ශණීයම හා ක්‍රමානුකූල අංශය තේරීමේ තරඟය පැවැත්විය. එහිදී ජයග්‍රහණය කරන ලද අංශයන් හා තත්ත්ව කව සඳහා සහතික හා ප්‍රශංසා කිරීම් ලිපි ලබා දී සේවක මණ්ඩලය දිරිගැන්වීමට ක්‍රියා කර ඇත.



**සර්වේයර් ජනරාල්තුමා විසින් ආකර්ශණීයම හා ක්‍රමානුකූල අංශයේ ජයග්‍රාහකයින් සඳහා සමරු ප්‍රදානය**

2014 වසරේ ඵලදායිතාලේකම් කාර්යාලය මඟින් පැවැත්වූ ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියට මිනින්දෝරු දෙපාර්තමේන්තුව, වයඹ පලාත් කාර්යාලය, ගම්පහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය හා මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ඉදිරිපත් වූ අතර එහිදී මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය විශේෂ කුසලතා සම්මානයක් හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව කුසලතා සම්මානයක් හිමි කරගන්නා ලදී.

**2015 වසරේ පැවැත්වූ ඵලදායිතා ප්‍රවර්ධන ආකල්ප වැඩමුළු පිළිබඳ විස්තර**

| අනු අංකය | දිනය | වැඩමුළුව | වැඩමුළු පැවැත්වූ ස්ථානය/ සහභාගී වූ කාර්යමණ්ඩලය | සහභාගී වූ සම්පත් දායකයාගේ නම | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1. | 2015.03.12 | ඵලදායිතා තත්ත්ව කව වල ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීමේ වැඩමුළුව | සර්වේයර් ජනරාල් කාර්යාලය ආයතන අංශය 1 සහ ආයතන අංශය 2 | එම්.බී.ඩී. ඩයස් මිය කේ.එච්.ඒ.ජී. විජේවර්ධන මයා | 52 |
| 2. | 2015.03.12 | ඵලදායිතා ප්‍රවර්ධන හා ආකල්ප වර්ධනය කිරීමේ වැඩමුළුව | කිලිනොච්චි, මුලතිවු ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල හා කිලිනොච්චි දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය | පිරතීපන් මයා එම්. ක්‍රිෂාන්ති මිය ප්‍රියදර්ශනී මෙය | 60 |
| 3. | 2015.04.28 | ඵලදායිතා ප්‍රවර්ධන හා ආකල්ප වර්ධනය කිරීමේ වැඩමුළුව | වවුනියාව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, වවුනියාව හා මන්නාරම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල | ආර්.ආර්. ජෙයරූපන් මයා එච්.එම්.පී. හේරත් මයා | 92 |
| 4. | 2015.10.28 | මානව සම්පත් කළමනාකරණ හා මනෝ විද්‍යාත්මක සහභාගීත්ව කළමනාකරණය පිළිබඳ දේශනය | සර්වේයර් ජනරාල් කාර්යාලයේ තත්ත්ව කව නායකයින් හා සාමාජිකයින් | කේ.එච්.ඒ.ජී. විජේවර්ධන මයා | 48 |
| 5. | 2015.11.26 | ඵලදායිතා තත්ත්ව කව වල ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීමේ වැඩමුළුව | සර්වේයර් ජනරාල් කාර්යාලයේ තත්ත්ව කව නායකයින් හා සාමාජිකයින් | එම්.බී.ඩී. ඩයස් මිය සී. සෙනෙවිරත්න මිය වජිර අළුත්ගේ මයා | 157 |

## 3.7 සහතික/බලපත්‍ර නිකුත් කිරීම්

3.7.1 බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීම - 9.0 බලන්න.

3.7.2 ප්‍රතීතන සහතික නිකුත් කිරීම - 6.6.8 බලන්න

2002 අංක 17 දරණ මැනුම් පනත යටතේ මැනුම් සභාව විසින් බලයලත් මිනින්දෝරුවන් සඳහා බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

## 4.0 මූල්‍ය කළමනාකරණය

දෙපාර්තමේන්තු ගිණුම් පද්ධතිය ගෙවීමේ කාර්යාල 35 කින් සමන්විතය. එනම්, ප්‍රධාන කාර්යාලය, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල 9ක්, දිස්ත්‍රික් මැනුම් කාර්යාල 25ක් සහ දියතලාවේ පිහිටි මැනුම් සහ සිතියම්ගත කිරීමේ ආයතනය යන ආයතන එකී ගෙවුම් කාර්යාල වේ. සමාලෝචනයට භාජනය වන වසර තුල දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු අංක 04, 05 සහ 06 යන ඇමුණුම් වල පෙන්වා ඇත.

4.1 වැය ඇස්තමේන්තුව - *ඇමුණුම 04*
4.2 අත්තිකාරම් "බී" ගිණුම - *ඇමුණුම 05*
4.3 ආදායම් ගිණුම - *ඇමුණුම 06*

## 5.0 භෞතික සම්පත් කළමනාකරණය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, දියතලාවේ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල 09 ක්, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල 25 ක් දෙපාර්තමේන්තුව සතු භෞතික සම්පත් ලෙස පවතින අතර ප්‍රාදේශීය කාර්යාල 35ක් දෙපාර්තමේන්තුව සතු හා රජයේ ගොඩනැගිලිවල පවත්වා ගෙන යනු ලැබේ. ප්‍රාදේශීය කාර්යාල 55ක් පමණ කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිලිවල පවත්වා ගෙන යනු ලබන අතර, මේ සඳහාද නව ගොඩනැගිලි ඉදි කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව ඉටුකර ගත යුතුව ඇත. මේ හැර හා සංචාරක බංගලා 11ක් සහ නිල නිවාස ද දෙපාර්තමේන්තුව සතුව ඇත.

## 5.1 නිශ්චල සහ චංචල සම්පත් සංවර්ධනය

2015 වසර තුලදී ඉටු කරන ලද රු. 50,000.00ට වැඩි තැනීම් හා අළුත්වැඩියාවන් පහත පරිදි වේ.

| | පළාත | විස්තරය | වියදම (රු.) |
|---|---|---|---|
| 1. | බස්නාහිර පළාත | ලේඛනාගාරයේ රාක්ක සැකසීම සඳහා යකඩ පටි ලබා ගැනීම | 116,000.00 |
| 2. | | පරිගණක යාවත්කාලීන කිරීම | 242,000.00 |
| 3. | සබරගමුව පළාත | කාණු පද්ධතියේ කොටසක් ඉදි කිරීම | 92,550.00 |
| 4. | | ජ්‍යෝ.මි.අ.කාර්යාල කාමරයේ ටයිල් ඇතිරීම | 176,495.00 |
| 5. | | ලේඛනාගාරයේ වේයන් මර්දන කටයුතු | 75,640.00 |
| 6. | උතුරු මැද පළාත | කැකිරාව ප්‍රා.මි.කා.පෙරසවි කඳවුරු බිම කොන්ක්‍රීට් කිරීම | 84,500.00 |
| 7. | | අනුරාධපුර ප්‍රා.මි.කා.හට්සන් බෝඩ් යොදා වෙන් කිරීම | 73,800.00 |
| 8. | | පෙරසවි නිවාස 55<br>ටකරන් සෙවිලි තහඩු ආවරණය කිරීම හා තීන්ත ආලේප කිරීම | 55,500.00 |
| 9. | | පෙරසවි නිවාස 49<br>ටකරන් සෙවිලි තහඩු ආවරණය කිරීම | 59,530.00 |
| 10. | | පෙරසවි නිවාස 58<br>අත්තිවාරමේ සිට වහල මට්ටම දක්වා බිත්ති බැඳීම හා වහලයට සීට් හා ලී මිලට ගැනීම | 499,965.50 |
| 11. | | තෝපා වැව තාවකාලික පිල්ලකුණු ප්‍රතිසංස්කරණය | 110,000.00 |

| | පළාත | විස්තරය | වියදම (රු.) |
|---|---|---|---|
| 12. | උතුරු පළාත | මි.අ.ඒකකය සඳහා අංක 143 කුටියේ අලුත්වැඩියා කටයුතු | 228,365.00 |
| 13. | | මායිම් තාප්ප වැඩ | 243,252.50 |
| 14. | | ප.ස.ජ.කාර්යාලයේ (උ.ප.)ඉදිරිපස වහලයේ වැඩ | 55,894.00 |
| 15. | | කාර්යාල අලුත්වැඩියා(කියුබිකල් වැඩ/සායම්වැඩ/සිවිලිම/විදුලි පංකා සවි කිරීම) | 99,765.00 |
| 16. | | 169 කූඩාරම සඳහා අලුතින් ඉදිකරන ලද වැසිකිලිය | 75,322.50 |
| 17. | | ගේට්ටු වැඩ(ද්විත්ව ගේට්ටු 1 සහ තනි ගේට්ටු 1) | 105,875.00 |
| 18. | | මුරකරු කුටි වැඩ සහ පින්තාරු වැඩ | 76,305.00 |
| 19. | | මායිම් තාප්ප පින්තාරු කිරීම | 71,415.00 |
| 20. | | පරිගණක/ජ්‍යො.මි.අ.කාර්යාලය බිම ටයිල් කිරීම | 88,350.00 |
| 21. | | භූමිතික මැනුම් ඒකකයේ වහල අලුත්වැඩියාව | 401,332.94 |
| 22. | | කාර්යාල වැසිකිලි(ගැහැණු/පිරිමි) | 67,260.00 |
| 23. | | ප.ස.ජ.කාර්යාලය සඳහා ගරාජයක් ඉදිකිරීම | 254,515.88 |
| 24. | | ලේඛනාගාරයේ අල්මාරිවල වැඩ | 81,600.00 |
| 25. | | නව පෙරසවි කුටි ඉදිකිරීම | 159,308.00 |
| 26. | | මුලතිව් ප්‍රාදේශීය කාර්යාලයේ වැසිකිලි | 53,805.00 |
| 27. | | කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලයේ වහල අලුත්වැඩියා කිරීම | 54,692.00 |
| 28. | | කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලයේ පෙරසවි නිවාසය සඳහා වැසිකිලියක් ඉදිකිරීම | 75,000.00 |
| 29. | | මුලතිව් දිස්ත්‍රික් කාර්යාලයේ පෙරසවි නිවාසය ඉදිකිරීම | 189,978.00 |
| 30. | | කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලයේ වැසිකිලියක් ඉදිකිරීම | 250,070.00 |
| 31. | | වව්නියා දිස්ත්‍රික් කාර්යාලයේ අංක147හා148 කුටි අලුත්වැඩියාව | 190,333.00 |
| 32. | | වව්නියා දිස්ත්‍රික් කාර්යාලයේ ටයිල් වැඩ | 488,037.50 |
| 33. | | මන්නාරම දිස්ත්‍රික් කාර්යාලයේ වැට සැකසීම | 150,280.00 |
| 34. | | මන්නාරම දිස්ත්‍රික් කාර්යාලයේ පස් පිරවීම | 97,650.00 |
| 35. | | වව්නියා දිස්ත්‍රික් කාර්යාලයේ 151 හා 152 පෙරසවි කුටි අලුත්වැඩියාව | 355,286.00 |
| 36. | | මන්නාරම දිස්ත්‍රික් කාර්යාලයේ මුර කුටියක් හා විවේක කාමරයක් ඉදිකිරීම | 360,975.00 |
| 37. | වයඹ පළාත | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය ඇතුළත පාටිෂන් කිරීම | 70,000.00 |
| 38. | | දි.මි.කා.ගේට්ටුව අසල අළුත්වැඩියා කිරීම හා කාණු පද්ධතිය සකස් කිරීම | 113,273.50 |
| 39. | | මහව ප්‍රා.මි.කා. ආදර්ශ කාර්යාලයක් ලෙස වැඩි දියුණු කිරීම | 368,875.00 |
| 40. | | ජ්‍යො.මි.අ. නිල නිවස අළුත්වැඩියා කිරීම හා තීන්ත ආලේප කිරීම | 857,600.57 |
| 41. | | පරිගණක යාවත්කාලීන කිරීම | 245,000.00 |
| 42. | | දි.මි.කා.ලේඛනාගාරය ටයිල් කිරීම | 204,436.80 |
| 43. | | පරිගණක අළුත්වැඩියාව | 114,900.00 |
| 44. | | දි.මි.කා.විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 62,340.00 |
| 45. | | දිස්ත්‍රික් කාර්යාලයේ පරිගණකයක් යාවත්කාලීන කිරීම | 54,950.00 |
| 46. | මධ්‍යම පළාත | ගරාජයේ වහලය ගලවා අලුතින් සකස් කර අමානො තහඩු සෙවිලි කිරීම. | 183,103.50 |
| 47. | | වානේ අල්මාරි අළුත්වැඩියා කර තීන්ත ආලේප කිරීම. | 76,485.00 |
| 48. | | දම්රෝ ඔෆිස් වර්ක්ස් ස්ටේෂන් 04 ක් මිලදී ගැනීම.(දොළුව ප්‍රා.මි.කා/මාතලේ ප්‍රා.මි.කා. සඳහා 02 බැගින්) | 541,195.00 |
| 49. | දකුණු පළාත | ජ්‍යො.මි.අ.නිල නිවස අළුත්වැඩියාව | 408,960.50 |
| 50. | | ඇල්පිටිය ප්‍රා.මි.කා.අළුත්වැඩියාව | 128,064.00 |
| 51. | | ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියාව | 76,325.00 |
| 52. | | මි.අ. මූලස්ථාන නිල කාමරය සැකසීම | 59,808.00 |
| 53. | | ජ්‍යො.මි.අ.නිල නිවසේ වහලය අළුත්වැඩියාව | 56,480.00 |
| 54. | | හම්බන්තොට ප්‍රා.මි.කා. තීන්ත ආලේප කිරීම | 164,300.00 |

| | පළාත | විස්තරය | වියදම (රු.) |
|---|---|---|---|
| 55. | | ලේඛනාගාරයේ රාක්ක තට්ටු සැකසීම | 100,824.00 |
| 56. | | පරිගණකය යාවත්කාලීන කිරීම | 57,250.00 |
| 57. | | පළාත්කාර්යාලීය ගබඩා කාමරයේ ලිපිගොනු සඳහා ඇළුමිනියම් රාක්ක සැකසීම | 84,500.00 |
| 58. | | ත්‍රිකුණාමල ප්‍රා.මි.කා. පෙරසවි කුටි අලුත්වැඩියාව | 99,550.00 |
| 59. | | ත්‍රිකුණාමල ප්‍රා.මි.කා. භූමිය පුළුල් කිරීම | 101,700.00 |
| 60. | | කුච්චවේලි සංචාරක බංගලාවේ ගේට්ටුව සහ වැට සැකසීම | 234,000.00 |
| 61. | | මඩකලපුව දි.කා.පැරණි සිවිලිම ඉවත්කර ජිප්සම් බෝඩ් යෙදීම | 66,440.00 |
| 62. | | ජ්‍යො.මි.අ.(මඩකලපුව) නිල නිවස සඳහා තීන්ත මිලදී ගැනීම | 84,995.00 |
| 63. | | ජ්‍යො.මි.අ.(මඩකලපුව) කාමරය සඳහා වායුසමීකරණ යන්ත්‍රයක් මිලදී ගැනීම | 202,900.00 |
| 64. | | මඩකලපුව දි.කා සඳහා 2x2 ටයිල් මිලදී ගැනීම | 69,000.00 |
| 65. | | මඩකලපුව දි.කා.පිටතවහලය සඳහා සිවිලිම යෙදීම | 300,000.00 |
| **66.** | | කල්ලඩි ප්‍රා.මි.කා.ගොඩනැගිලි සම්බන්ධකිරීමේ ඉදිකිරීම් කටයුතු සඳහා කුළුනු සහ ලින්ටල් යෙදීම | 59,475.00 |
| **67.** | නැගෙනහිර පළාත | - එම - සිමෙන්ති බ්ලොක් ගල් සඳහා | 89,600.00 |
| **68.** | | - එම - බිත්ති බැඳීම සඳහා | 60,000.00 |
| 69. | | - එම - වහලය සඳහා | 495,000.00 |
| 70. | | - එම - ඇළුමිනියම් සහ වීදුරු යෙදූ ජනේලය සෑදීම සහ සවිකිරීම | 51,000.00 |
| 71. | | - එම - කපරාරුව සඳහා වැඩ කුලිය | 81,600.00 |
| 72. | | - එම - වහලය සඳහා අමුද්‍රව්‍ය මිලට ගැනීම | 177,390.00 |
| 73. | | - එම - විදුලිඋපකරණ මිලට ගැනීම | 137,177.00 |
| 74. | | - එම - තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලට ගැනීම | 69,300.00 |
| 75. | | - එම - වහලය සඳහා ජිප්සම් බෝඩ් සිවිලිම යෙදීම | 133,200.00 |
| 76. | | - එම - පොළොව සැකසීමේ අමුද්‍රව්‍ය සහ වැඩ කුලිය | 75,000.00 |
| 77. | | මඩකලපුව දි.කා. වැසිකිලි ටයිල් කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය මිලට ගැනීම | 166,570.00 |
| 78. | | වන්තාරුමුලෙයි ප්‍රා.මි.කා. ගරාජය පුළුල් කිරීම | 58,640.00 |
| 79. | | දි.මි.කා.පිටුපස ගල් බැම්ම සකස් කිරීම | 280,000.00 |
| 80. | | අම්පාර සංචාරක බංලාවෙහි වහලය හා නාන කාමර අළුත්වැඩියාව | 830,000.00 |
| **81** | | කාර්යාල ගොඩනැගිල්ලෙහි වැසිකිලි හා නාන කාමර අළුත්වැඩියාව | 68,035.00 |
| **82.** | | කාර්යාල ගොඩනැගිල්ලෙහි වහලය අළුත්වැඩියාව | 59,630.00 |
| **83.** | | කාර්යාල ගොඩනැගිල්ලෙහි විදුලි පරිපථ අළුත්වැඩියාව | 230,450.00 |
| **84.** | ඌව පළාත | කාර්යාල ගොඩනැගිල්ලෙහි දොර ජනෙල් අළුත්වැඩියාව | 108,000.00 |
| **85.** | | කාර්යාල ගොඩනැගිල්ලෙහි තීන්ත ආලේප කිරීම | 165,160.00 |
| **86.** | | ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම | 62,557.00 |
| **87.** | | දි.මි.කා. මොණරාගල ප්‍රා.මි.කා. ලේඛනාගාරය හා නිල නිවාස 5 ක වේයන් මර්දනය කිරීම | 348,750.00 |
| **88.** | | ජ්‍යො.මි.අ.(බදුල්ල) කාර්යාල කාමරය වෙන් කිරීම | 111,150.00 |
| **89** | | පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය සෑදීම | 14,683,878.72 |
| **90** | | නිලාවේලි සංචාරක බංගලාව | 12,140,255.24 |
| **91.** | | ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය | 16,029,013.55 |
| **92.** | | ත්‍රිකුණාමලය දි.මි.කා. | 31,649,275.44 |
| **93.** | **ස.ජ.කා.** | ගුවන් මැනුම් අංශය පාටිෂන් කිරීම | 286,433.28 |
| **94.** | **කොළඹ** | පාරිභෝගික සේවා අංශයේ වීදුරු දොර | 94,085.82 |
| 95. | | පාරිභෝගික සේවා අංශයේ වානේ කබඩ් සෑදීම | 269,750.00 |
| 96. | | පාරිභෝගික සේවා අංශයේ බිම කපා පොලිෂ් කිරීම | 186,000.00 |
| 97. | | විභාග අංශය පාටිෂන් කිරීම | 642,215.00 |
| 98. | | පරිගණක අංශය බිම කපා පොලිෂ් කිරීම | 153,600.00 |

| | පළාත | විස්තරය | වියදම (රු.) |
|---|---|---|---|
| 99. | | පරිගණක අංශය බිම කාපට් කිරීම | 102,300.00 |
| 100 | | දුරස්ථ ග්‍රහණ අංශය පාටිෂන් කිරීම | 102,270.00 |
| 101 | | ගබඩා අංශය පාටිෂන් කිරීම | 584,950.00 |
| 102 | | අංක 15 දරණ වැසිකිළියේ බිම ජල නිවාරණය කිරීම | 52,500.00 |
| **103** | | අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම | 72,007.00 |
| 104 | | දෙවන මහලේ අංක 9,10 සහ පළමු මහලේ අංක 20,21,22,23,24 යන වැසිකිලි අළුත්වැඩියා කිරීම | 3,113,753.86 |
| 105 | | ජල නල පද්ධතිය අළුත්වැඩියා කිරීම | 5,437,570.48 |
| **106** | | සර්වේයර් ජනරාල් කාමරයේ ඇතුළත වැඩ | 2,140,503.97 |
| **107** | | කොරිඩෝ පාටිෂන් කිරීම(ලේ.කළ.අංශය) | 58,421.52 |
| **108** | | සෝපානය අළුත්වැඩියා කිරීම | 588.901.65 |
| **109** | | ගිනි නිවන උපකරණ නැවත පිරවීම | 92,074.50 |
| **110** | | පැන්ට්‍රි කබඩ්(පාලන අංශය) | 94,350.00 |
| **111** | | ලේ.කළ.අංශය පාටිෂන් කිරීම | 126,250.00 |
| **112** | | පාරිභෝගික සේවා අංශය සඳහා ලිතෝ අංශයේ කොටසක් පාටිෂන් කිරීම | 114,025.00 |
| **113** | | භූමිතික අංශය පාටිෂන් කිරීම | 871,152.00 |
| **114** | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව | දුරකතන පද්ධතිය අලුත්වැඩියාව | 68000.00 |
| **115** | | කාන්තා, පිරිමි නේවාසිකාගාර අලුත්වැඩියා හා තීන්ත ආලේපනය. | 206005.00 |
| **116** | | විදුලි කාර්මික අංශයට භාණ්ඩ මිලදී ගැනීම. | 262835.00 |
| **117** | | ජලනල අංශයට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම. | 202075.00 |
| **118** | | CB2 සංචාරක බංගලාව සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම. | 366091.00 |
| **119** | | දැව මිලදී ගැනීම. | 90850.00 |
| **120** | | විධායක පුටු මිලදී ගැනීම. | 120262.50 |
| **121** | | CB2 සංචාරක බංගලාව නැවත විදුලිය තැනදීම. | 78153.00 |
| **122** | | CB2 සංචාරක බංගලාවට අවශ්‍ය උද්‍යාන පුටු මිලදී ගැනීම. | 50000.00 |
| **123** | | CB3 සංචාරක බංගලාව හා අංක 45 නිවාඩු නිකේතනය අලුත්වැඩියා හ හා තීන්ත ආලේපනය. | 174133.00 |
| **124** | | CB2 , CB3 හා අංක 45 දොර ජනෙල්රෙදි දැමීම. | 226771.00 |
| **125** | | අංක 27 තීන්ත ආලේපනය. | 62033.00 |
| **126** | | බහුකාර්ය වඩු මැෂිමක් මිලදී ගැනීම. | 85500.00 |
| **127** | | 6B, 4B නිවාසවල තීන්ත ආලේපනය. | 95492.00 |
| **128** | | කෞතුකාගාර පැරණි උපකරණ සුරක්ෂිතව තබා ගැනීමට වීදුරු පෙට්ටි මිලදී ගැනීම. | 154500.00 |
| **129** | | කථිකාචාර්ය කාර්යාලය සඳහා අවශ්‍ය භාණ්ඩ ලබාගැනීම. | 124650.00 |

## 5.2 උපකරණ අංශය

2015 වර්ෂයේ දී උපකරණ සංචිතය සඳහා නව පූර්ණමාන 27ක් එක්විය. ඒ අනුව අංශයෙන් මෙහෙයවිය යුතු උපකරණ සංඛ්‍යාව 344ක් විය. උපකරණ ශිල්පී කාර්ය මණ්ඩලයේ අඩුවක් තිබුණද සේවා අලුත්වැඩියා කටයුතු නිසි පරිදි ඉටුකර දීමට හැකිවිය.

අවුරුදු 20ක් භාවිතයට ගත් set 3B පූර්ණමාන වල තවදුරටත් භාවිතයට ගත හැකි කොටස් සකසා ගබඩා අංශයට භාර දී එමගින් ක්ෂේත්‍ර කාර්යාල වෙත ස්ථිර ලෙස අමතර උපාංග ලබා දීමට සැලසුම් කර ඇති අතරඑමගින් ක්ෂේත්‍ර කාර්යයන් කිරීමට පහසුවක් ඇති වේ.

උපකරණ අංශයේ කාර්ය මණ්ඩලයට උපකරණ කාර්මික ශිල්පී නිලධාරීන් හිඟයක් ඇතිව තිබෙන අතර ඊට පිළියම් යෙදීමට පියවර ගෙන ඇත.

පාලන ලක්‍ෂ්‍ය ස්ථාපිත කිරීම සඳහා ලොකු, කුඩා හා විශේෂිත වර්ගවල පිත්තල පාලන ලක්ෂ්‍ය 5345 ක් සපයමින් භූමිතික අංශයේ කටයුතු සඳහා දායකත්වය සපයා දෙන ලදී.

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා දෙපාර්තමේන්තු හැඳුනුම්පත් 325 ක ප්‍රමාණයක් අළුතින් සාදා දෙන ලදී.

කාර්ය මණ්ඩල නේවාසික අවශ්‍යතා සඳහා භාවිත නොකළ තත්ත්වයක පිහිටි කැකිරාව, පුත්තලම, හසලක වැනි ස්ථානවල තිබූ පෙරසවි කදවුරු ගලවා කැකිරාව, මුලතිව් හා කිලිනොච්චි ප්‍රදේශවල අළුතින් ඉදිකිරීමට පියවර ගනු ලැබීය.

දෙපාර්තමේන්තුවේ ඵලදායිතා සංකල්පයට උර දෙමින් වඩු අංශයේ දායකත්වයද සපයා දෙපාර්තමේන්තුව තුළ තිබූ සම්පත් භාවිතයෙන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ කාර්යාල නාමකරණයට අදාල පුවරු සවිකරන ලදී. ඒ අනුව මහජනයාට ඉතා පහසුවෙන් පරිශ්‍රයේ ඇති කාර්යාල වෙත ගමන් කිරීමට මග දැක්වෙන අතර දෙපාර්තමේන්තුවේ අංශවලින් කෙරෙන කාර්යයන් පිළිබඳ අදහසක් ලබා දීමටද මෙමගින් හැකිවිය.

ප්‍රධාන පිවිසුම වෙත පැමිණි අයෙකුට අභ්‍යන්තර කාර්යාල විස්තර හා ගමන්මග විස්තර කෙරෙන පුවරු අනුව ගමන් කරමින් අපහසුවකින් තොරව අවශ්‍ය රාජකාරී ඉටුකර ගැනීමට අවශ්‍ය අංශ වෙත යාමට පහසුකම් සැලසී ඇත.

## 5.3 වාහන හා යන්ත්‍ර සූත්‍ර නඩත්තුව

වාහන 77 ක රුපියල් 50,000.00 ඉක්ම වූ අළුත්වැඩියාවන් සිදු කර ඇත. ඒවා පළාත් අනුව පහත සඳහන් කර ඇත.

| | නඩත්තු කටයුතු කල වාහන ගණන | වැය වූ මුළු මුදල රු. |
|---|---|---|
| ස.ජ.කාර්යාලය | 08 | 734,637.95 |
| බස්නාහිර පළාත | 31 | 3,782,469.70 |
| මධ්‍යම පළාත | 01 | 182,650.00 |
| සබරගමුව පළාත | 07 | 768,171.00 |
| උතුරු මැද පළාත | - | - |
| වයඹ පළාත | 12 | 15,995,544.13 |
| ඌව පළාත | 04 | 939,360.00 |
| දකුණු පළාත | 03 | 363,134.05 |
| උතුරු පළාත | 06 | 1,170,098.15 |
| නැගෙනහිර පළාත | 06 | 1,505,827.00 |
| මැ.සි.ආයතනය | 05 | 778,480.90 |
| **එකතුව** | 77 | 24,714,545.88 |

## 5.4 ප්‍රසම්පාදන හා සැපයීම් අංශය

සර්වේයර් ජනරාල් කාර්යාලයේ විවිධ අංශ, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සහ රට පුරා විසිරී සිටින මිනින්දෝරුවරුන් විසින් නඩත්තු කර ගෙන යනු ලබන ගබඩා ලෙජර 708ට අදාලව ගබඩා සමීක්ෂණ කටයුතු නිමකර ඇත.

ඒවායින් රජයේ මිනින්දෝරුවරුන් සියල්ලටම ද, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල සියල්ලටම ද, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල සියල්ලටමද, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සියල්ලටම ද, දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ ඇති ගබඩා ඒකක සියල්ලටම ද, සංචාරක බංගලා සහ නිවාඩු නිකේතන සියල්ලටමද, සර්වේයර් ජනරාල් කාර්යාලයේ අංශ සියල්ලටමද අඩු ලුහුඬින් තොර සහතික ලබා දී ගොනු නිරවුල් කරන ලදී.

විශ්‍රාම ගිය නිළධාරීන් 05 දෙනෙකු හා ඉල්ලා අස්වී ගිය නිලධාරීන් 03 දෙනෙකු සඳහා ස්ථිර නිශ්කාෂණද නිලධාරීන් 21 දෙනෙකු සඳහා තාවකාලික නිශ්කාෂණද ලබා දී ඇත.
2015 වසර තුලදී රුපියල් මිලියන 79.4 කට අධික ප්‍රාග්ධන භාණ්ඩ ද, රුපියල් මිලියන 10.7 අධික පුනරාවර්තන භාණ්ඩ ද, බිම්සවිය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 4.9 කට අධික ප්‍රාග්ධන භාණ්ඩ හා රුපියල් මිලියන5.5කට අධික පුනරාවර්තන භාණ්ඩද ප්‍රසම්පාදනය කර ඇත.

## 6.0 සංවර්ධන ක්‍රියාකාරකම්

මේ වසර තුලද රජය දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරන ලද බැවින්, ඒවායේ ආරම්භකයින්ගෙන් ප්‍රමුඛයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවද තම කාර්යභාරය ඉටු කරන ලදී.

### 6.1 ඉඩම් මැනුම්

සමාලෝචනයට භාජනය වූ වසර තුල කරන ලද විවිධ වර්ගයේ මැනුම්වල ප්‍රගතිය පහත දැක්වේ.

| මැනුම් වර්ගය | භෞතික ප්‍රගතිය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | | සමුච්චිත ඉලක්කය | | සමුච්චිත ප්‍රගතිය | | | ලබාගත් ප්‍රගතිය (%) |
| | මිනින්දෝරු මාස | කැබලි | මිනින්දෝරු මාස | කැබලි | මිනින්දෝරු මාස | කැබලි | මැනුම් ඉල්ලීම් | මිනින්දෝරු මාස |
| මායිම් ගල් දැමීමේ මැනුම් | 1901 | 49413 | 1857 | 37135 | 1652 | 36820 | 2920 | 89 |
| විවිධ මැනුම් | 710 | 18460 | 796 | 15928 | 965 | 34703 | 2293 | 121 |
| ඉඩම් අත්කර ගැනීමේ මැනුම් | 800 | 20787 | 607 | 15168 | 864 | 26092 | 679 | 142 |
| ඉංජිනේරු මැනුම් | 209 | හෙක්.4180 | 60 | හෙක්.1208 | 67 | හෙක්.349 | 44 | 111 |
| සිතියම්කරණය සඳහා පාලන ලක්‍ෂ්‍ය පිහිටුවීම | 82 | | 91 | | 240 | | 305 | 263 |
| උසාවි කොමිෂන් මැනුම් | 340 | 10200 | 374 | 5613 | 428 | 7425 | 519 | 114 |
| කැඩැස්තර මැනුම් | 2606 | 111580 | 2437 | 94402 | 2754 | 68549 | 998 | 113 |
| භූගෝලීය ස්ථානීය ලක්‍ෂ්‍ය පිහිටුවීම | 324 | ලක්‍ෂ්‍ය 8100 | | ලක්‍ෂ්‍ය 8020 | 298 | ලක්‍ෂ්‍ය 7444 | | 93 |
| **එකතුව** | **6972** | **222720** | **6222** | **177474** | **7268** | **181382** | **7758** | **1046** |

**2015 වසරේ සිදු කරන ලද විශේෂ මැනුම් කාර්යයන්ද පහත දැක්වේ**

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් මැනීම වව්නියාව, මන්නාරම, ත්‍රිකුණාමලය, අම්පාර, යාපනය, කිලිනොච්චිය, මඩකලපුව, මුලතිව් ( මායිම් ගල් දැමීමේ මැනුම් හා අත්කර ගැනීමේ මැනුම්)
- බොල්ගොඩ ගහ මැනීම (කි.මී.35).
- රුවන්පුර අධිවේගී මාර්ගයේ මැනුම් කටයුතු.(15.9).
- වාද්දුව - මොරොන්තුඩුව මාර්ගයේ අත්කර මැනීමේ මැනුම්.
- බදුල්ල වෙන්කලාඩි මාර්ගයේ අත්පත් කර ගැනීමේ මැනුම්.
- මිරිජ්ජවිල - සූරියවැව මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ අත්කර ගැනීමේ මැනුම්
- කතරගම -බෙරලිගල-ලුණුගම්වෙහෙර අධිවේගී මාර්ගයේ මැනුම් කටයුතු.
- දක්ෂිණ අධිවේගී මාර්ගයේ මාතර සිට හම්බන්තොට විස්තර මැනුම් හා අත්කර ගැනීමේ මැනුම්.
- මධ්‍යම අධිවේගී මාර්ගයේ විස්තර මැනුම් හා අත්කර ගැනීමේ මැනුම් කටයුතු.
- ප්‍රධාන ඇල මාර්ගයේ අත්පත් කර ගැනීමේ මැනුම්.
- යාන් ඔය අත්කර ගැනීමේ කටයුතු
- විශේෂ කාර්ය බලකා ඉඩම (සමෝච්ඡ රේඛා සහිතව) මැනුම් කටයුතු.
- රෝහල් සඳහා කරන ලද (සමෝච්ඡ රේඛා සහිතව) මැනුම් කටයුතු.
- වකුගඩු රෝහලක් ඉදිකිරීම සඳහා විස්තර මැනුම, සමෝච්ඡ රේඛා මැනුම
- කටුගහ ගල්ගේ පුරාණ විහාර සමෝච්ඡ රේඛා මැනුම.
- යුධගනාව රජමහා විහාර මැනුම.
- වන්දම දෙමලිය වනාන්තර මැනුම.
- මරගල කන්ද වනාන්තර මැනුම.
- උල්පත් වැව,අරුණපුර වනාන්තර මැනුම්
- උමා ඔය හඳපානාගල ජලාශයේ සිට ඇතිලි වැව දක්වා මැනුම්.
- කැකුණදුර රක්ෂිත මැනුම.
- ලංකා විදුලිබල මණ්ඩලයේ මැනුම්.
- තබ්බෝව රක්ෂිත මැනුම
- අනුරාධපුර පාදෙනිය මාර්ගයේ රක්ෂිතය නැවත ලකුණු කිරීම
- හලාවත වැවිලි සමාගමට අයත් පනාපිටිගම,කෙවිටිය,සිත්තම්පලම් වත්ත හා උනම්පිටිය මැනුම් කිරීම
- ස්ට්‍රන්ඩන් වත්ත මැනීම
- දැදුරු ඔය මැනුම් කටයුතු
- වයඹ ඇල මැනුම් කටයුතු
- මහකනදරාව වැව් මැනුම
- ජෙක්කුලම වැව
- බ්‍රාහ්මණයාගම හැරවුම් වේල්ල ඉංජිනේරු මැනුම
- ඉහළ ඇලහැර ව්‍යාපෘතිය
- ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මහවැලි මැනුම් අධික්ෂණය

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මැනුම් කර දීමනා පත්‍ර ලබාදීම සඳහා නිකුත් කරන ලද රේඛා චිත්‍ර පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | නිකුත් කරන ලද රේඛා චිත්‍ර ගණන | |
|---|---|---|
| | 2014 | 2015 |
| මහනුවර | 462 | 162 |
| මාතලේ | 381 | 710 |
| නුවරඑළිය | 556 | 76 |
| අනුරාධපුරය | 1938 | 2276 |
| පොළොන්නරුව | 595 | 737 |
| වවුනියාව | 221# | 5366 |
| යාපනය | 604 | 533 |
| කිලිනොච්චිය | 7* | 2070 |
| මුලතිව් | - | 1718 |
| මන්නාරම | - | 899 |
| මඩකලපුව | 637 | 913 |
| ත්‍රිකුණාමලය | 408 | 639 |
| කුරුණෑගල | 1186 | 2285 |
| පුත්තලම | 1565 | 1397 |
| රත්නපුර | 607 | 549 |
| කෑගල්ල | 181 | 173 |
| ගාල්ල | 820 | 416 |
| මාතර | 333 | 276 |
| හම්බන්තොට | 731 | 885 |
| බදුල්ල | 78 | 102 |
| මොනරාගල | 811 | 88 |
| අම්පාර | 3692 | 3349 |
| කොළඹ | 64 | 27 |
| ගම්පහ | 195 | 115 |
| කළුතර | 523 | 170 |
| එකතුව | **16595** | 25922 |

## 6.2 භූමිතික මැනුම් ඒකකයේ 2015 වසරේ කරන ලද කාර්යයන්

දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පිහිටුවා ඇති භූමිතික මැනුම් ඒකකය හා ඊට අනුබද්ධ බස්නාහිර, වයඹ හා දකුණු පළාතේ පිහිටුවා ඇති භූමිතික මැනුම් ඒකක මගින් ඉටු කරනු ලබන පාලන ලක්ෂ්‍ය පිහිටුවීම හා වෙනත් මැනුම් පිළිබඳ ප්‍රගතිය පහතින් දක්වා ඇත. මෙම ඒකකය අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) යටතේ පාලනය වේ.

## 6.2.1 පාලන ලක්ෂ්‍ය පිහිටුවීම ප්‍රගතිය

| විස්තරය | මැ.ආ.සි. | කොළඹ | වයඹ | දකුණ | මධ්‍යම | උතුර | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජී.පී.එස්. පාලන ලක්ෂ්‍ය | 2369 | 76 | 994 | 690 | 452 | 842 | 5421 |
| වෙනත් මැනුම් සඳහා තුලා ජී.පී.එස් පාලන ලක්ෂ්‍ය ගණන | 1632 | - | 843 | 509 | 384 | 322 | 3691 |
| නිම කරන ලද සම්පූර්ණ පාලන ලක්ෂ්‍ය ගණන | 4001 | 76 | 1837 | 1199 | 836 | 1164 | 9112 |
| නිමවූ පාලන ලක්ෂ්‍ය වලට තුල්‍ය මිනින්දෝරු මාස ගණන | 78.97 | 2.52 | 33.14 | 22.99 | 15.04 | 28.05 | 180.71 |
| වෙනත් මැනුම් සඳහා තුල්‍ය මිනින්දෝරු මාස ගණන | 54.41 | - | 28.09 | 16.97 | 12.81 | 10.74 | 123.02 |
| 2015 වසරේ නිම කරන ලද මුළු මිනින්දෝරු මාස ගණන | 133.38 | 2.52 | 61.23 | 39.96 | 27.85 | 38.79 | 303.73 |
| 2015 වසරේ ප්‍රගතිය | 161 | 50 | 118 | 82 | 68 | 82 | 110 |

## 6.2.2 වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු (දියතලාව භූමිතික අංශය)

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | භූමිතික පාලන ජාලය විස්තීරණය කිරීමේ වැඩ සටහන යටතේ බදුල්ල, නුවරඑළිය, රත්නපුර, පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි ද්විතියික මට්ටම් ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 2 | හදපානාගල වම් ඉවුරු ඇළ සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 3 | දෙමළිය- වන්දම, පස්සර වන රක්ෂිත මැනුම් සඳහා ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 4 | වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ‘ Hydrometeorological ‘ ස්ථාන 15 ක් සඳහා ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 5 | කටුනායක ,බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන්යානා ගොඩබෑම් සිදුකරන රේඛාවේ දෙපස 10 Km ප්‍රචාරනයක බාදක මැනුම් (Obstacle data collection survey-Area 2b ) සිදු කිරීම. |
| 6 | වරාය අධිකාරිය සඳහා කොළඹ වරායේ ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 7 | හම්බන්තොට වරාය හා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල අතර අධිවේගී මාර්ගය හා දක්ෂින අධිවේගී මාර්ගය සඳහා ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 8 | නගර සිතියම් සැකසීම සඳහා බදුල්ල නගරය ආශ්‍රිතව භූමි පාලන ලක්ෂ සඳහා ජී.පී.එස්. නිරීක්ෂණ ඛණ්ඩාංක ලබා දීම. |
| 9 | LIDAR ව්‍යාපෘතිය සඳහා බදුල්ල, නුවර එළිය දිස්ත්‍රික්කයන්හි භූමි පාලන ලක්ෂ්‍ය ජී.පී.එස්. නිරීක්ෂණ සහ එම ව්‍යාපෘතිය සඳහා නුවරඑළිය , දියතලාව සහ බදුල්ල Base Station සිට ජී.පී.එස්. නිරීක්ෂණ දත්ත ලබා දීම. |
| 10 | බිම්සවිය හා විකිර්ණ මැනුම් සඳහා රත්නපුර,බදුල්ල,මහනුවර,කළුතර දිස්ත්‍රික්කයන්හි ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |

**යථාතත්‍ය මට්ටම් ගැනීම - දියතලාව භූමිතික අංශය**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | නුවරඑළිය-ගම්පොල, නුවරඑළිය-ගිනිගත්හේන, කොඩුවාමඩු-නාසවන්තිවු, මඩකලපුව-කොඩුවාමඩු, ගලේකන්ද-බදුල්ල, මෝදර-අවිස්සාවේල්ල යථාතත්‍ය මට්ටම් ගැනීමේ මැනුම්. |
| 2 | හදපානාගල වම් ඉවුරු ඇළ , වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ Hydrometerological ස්ථාන ,බ්‍රෝඩ්ස්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතිය ,රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සහ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල බාදක මැනුම් ව්‍යාපෘති සඳහා පිල් ලකුණු පිහිටුවීම. |
| 3 | LIDAR ව්‍යාපෘතිය සදහා බදුල්ල, නුවර එළිය, ගම්පහ, කුරුණෑගල, දිස්ත්‍රික්කයන්හි තෘතියික මට්ටම් ගැනීමේ මැනුම්. |

## 6.2.3 වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු (මධ්‍යම පළාත් භූමිතික මැනුම් ඒකකය)

| අනු අංකය | කාර්යය |
|---|---|
| **1** | භූමිතික පාලන ජාලය පුළුල් කිරීම යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ද්විතියික මට්ටම් ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| **2** | බිම්සවිය හා විකිර්ණ මැනුම් සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුල ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| **3** | LIDAR ව්‍යාපෘතිය සදහා මහනුවර සහ කෑගල්ල දිස්ත්‍රික්ක තුල භූමි පාලන ලක්ෂ්‍ය ජී.පී.එස්. නිරීක්ෂණ සහ එම ව්‍යාපෘතිය සදහා කෑගල්ල Base Station සිට ජී.පී.එස්. නිරීක්ෂණ දත්ත ලබා දීම. |

**යථාතත්‍ය මට්ටම් ගැනීම - මධ්‍යම පළාත් භූමිතික මැනුම් ඒකකය**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | නුවරඑළිය-ගම්පොල, නුවරඑළිය-ගිනිගත්හේන, කොඩුවාමඩු-නාසවන්තිවු, මඩකලපුව-කොඩුවාමඩු, ගලේකන්ද-බදුල්ල, මෝදර-අවිස්සාවේල්ල යතාතත්‍ය මට්ටම් ගැනීමේ මැනුම්. |
| 2 | හදපානාගල වම් ඉවුරු ඇළ , වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ Hydrometerological ස්ථාන ,බ්‍රෝඩ්ස්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතිය ,රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සහ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල බාධක මැනුම් ව්‍යාපෘති සඳහා පිල් ලකුණු පිහිටුවීම. |
| 3 | LIDAR ව්‍යාපෘතිය සදහා බදුල්ල, නුවර එළිය, ගම්පහ, කුරුණෑගල, දිස්ත්‍රික්කයන්හි තෘතියික මට්ටම් ගැනීමේ මැනුම්. |

## 6.2.4 වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු (උතුරු පළාත් භූමිතික මැනුම් ඒකකය)

| අනු අංකය | කාර්යය |
|---|---|
| **1** | භූමිතික පාලන ජාලය පුළුල් කිරීම යටතේ කිලිනොච්චි සහ යාපනය දිස්ත්‍රික්කයන්හි ද්විතීයික මට්ටම් ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| **2** | ඉරණමඩු ජලාශයේ පහල සහ ඉහල ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා .පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| **3** | කිවුල් ඔය ව්‍යාපෘතිය සඳහා .පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| **4** | වනාන්තර මායිම් නිරූපනය කිරීමේ මැනුම් සඳහා මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |

**යථාතත්‍ය මට්ටම් ගැනීම - උතුරු පළාත් භූමිතික මැනුම් ඒකකය**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | කයිතඩි-මාන්කුලම් යථාතත්‍ය මට්ටම් ගැනීමේ මැනුම්. |
| 2 | කිවුල්ඔය සහ ඉරණමඩු ජලාශ ව්‍යාපෘතිය සඳහා පිල් ලකුණු පිහිටුවීම. |
| 3 | LIDAR ව්‍යාපෘතිය සඳහා මහනුවර, කෑගල්ල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි තෘතියික මට්ටම් රේඛා පිහිටුවීම. |

## 6.2.5 වර්ෂය තුල සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු (වයඹ පළාත් භූමිතික මැනුම් ඒකකය)

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | වනාන්තර මායිම් නිරූපනය කිරීමේ මැනුම් සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 2 | බ්‍රාහ්මණයාගම ඇළ ව්‍යාපෘතිය සඳහා ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 3 | LIDAR ව්‍යාපෘතිය සඳහා කුරුණෑගල, ගම්පහ දිස්ත්‍රික්කයන්හි භූමි පාලන ලක්ෂ්‍ය ජී.පී.එස්. නිරීක්ෂණය සහ එම ව්‍යාපෘතිය සඳහා රුවන්වැල්ල, ගම්පහ පාලන ලක්ෂ්‍යයන්හි ( Base Station) සිට ජී.පී.එස්. නිරීක්ෂණ දත්ත ලබා දීම. |

**යථාතත්‍ය මට්ටම් ගැනීම - වයඹ පළාත් භූමිතික මැනුම් ඒකකය**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | කයිතඩි-මාන්කුලම් යථාතත්‍ය මට්ටම් ගැනීමේ මැනුම්. |
| 2 | කිවුල්ඔය සහ ඉරණමඩු ජලාශ ව්‍යාපෘතිය සඳහා පිල් ලකුණු පිහිටුවීම. |
| 3 | LIDAR ව්‍යාපෘතිය සඳහා මහනුවර ,කෑගල්ල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි තෘතියික මට්ටම් රේඛා පිහිටුවීම. |

### 6.2.6 වර්ෂය තුල සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු (දකුණු පළාත් භූමිතික මැනුම් ඒකකය)

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | භූමිතික පාලන ජාලය පුළුල් කිරීමේ වැඩ සටහන යටතේ ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි ද්විතියික මට්ටම් ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 2 | "1000 Bridges" ව්‍යාපෘතිය යටතේ හබරාදූව ප්‍රා.ලේ.කොට්ඨාශයේ ජී.පී.එස්.පාලන ලක්ෂය පිහිටුවීම. |
| 3 | මාර්ග සංවර්ධන අධිකාරි මැනුම් සඳහා මාතර දිස්ත්‍රික්කයේ ජී.පී.එස්.පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 4 | බිම්සවිය සහ විකීර්ණ මැනුම් සඳහා කොළඹ, කළුතර, ගම්පහ, මාතර දිස්ත්‍රික්කයන්හි ජී.පී.එස්. පාලන ලක්ෂ්‍ය පිහිටුවීම. |
| 5 | LIDAR ව්‍යාපෘතිය සඳහා කොළඹ, කළුතර දිස්ත්‍රික්කයන්හි භූමි පාලන ලක්ෂ්‍ය ජී.පී.එස්. නිරීක්ෂණය සහ එම ව්‍යාපෘතිය සඳහා කොළඹ පාලන ලක්ෂයේ සිට (Base Station) ජී.පී.එස්. නිරීක්ෂණ දත්ත ලබා දීම. |

**යථාතත්‍ය මට්ටම් ගැනීම - දකුණු පළාත් භූමිතික මැනුම් ඒකකය**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | පානදුර-හොරණ, මෝදර-පානදුර යථාතත්‍ය මට්ටම් ගැනීමේ මැනුම්. |
| 2 | LIDAR ව්‍යාපෘතිය සඳහා ගම්පහ, කොළඹ, කළුතර, රත්නපුර දිස්ත්‍රික්කයන්හි තෘතීයික මට්ටම් රේඛා පිහිටුවීම. |

## 6.3 සිතියම්කරණය

දෙපාර්තමේන්තු කාර්යභාරයේ තවත් වැදගත් අංශයක් වනුයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය හූ ලක්ෂණාත්මක සිතියම්, සංඛ්‍යාංක හා විවිධ තේමා සිතියම් නිෂ්පාදනයයි. යම් කිසි ව්‍යාපෘතියකට අවශ්‍ය තොරතුරු දැක්වෙන සිතියම්, අදාල සේවා දායකයාගේ ඉල්ලීම පරිදි සකස් කර දෙනු ලැබේ. මුද්‍රිත සිතියම්, ගුවන් ජායාරූප සහ සංඛ්‍යාංක සිතියම් සංගත තැටි ලෙස නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශ වලින් ලබාගැනීම පෙර තිබූ ක්‍රමවේදය වූ අතර, 2015 නොවැම්බර් මස සිට නව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ස්ථාපිත කර එකම ස්ථානයකින් ඉහත සියලුම සේවාවන් සැපයීමට මේ වන විට කටයුතු කර ඇත. මීට අමතරව දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයෙන් හා සියලු දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලවලින් ගුවන් ඡායා රූප සහ සංඛ්‍යාංක සිතියම් හැර ඉතිරි සියළුම සිතියම් ලබා ගත හැක.

**<u>සිතියම් විකිණීමෙන් ලද ආදායම</u>**

මෙම වසරේ මුද්‍රිත සිතියම් හා සංඛ්‍යාංක දත්ත සිතියම් විකිණීමෙන් පහත සඳහන් පරිදි ආදායම උපයාගෙන ඇත.

| | | |
|---|---|---|
| මැනුම්පති කාර්යාලයෙන් | = රු. | **9,775,760.90** |
| මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය සහ දිස්ත්‍රික් මැනුම් කාර්යාලවලින් | = රු. | **2,135,015.50** |
| සංඛ්‍යාංක දත්ත (නොවැම්බර් - දෙසැම්බර්) මාස තුල ආදායම | = රු. | **2,810,756.95** |
| **2015** වසරේ සිතියම් නිෂ්පාදනයේ මුළු ආදායම | = රු. | **14,721,533.35** |

2015 වසරේ පැවති ජාත්‍යාන්තර පොත් ප්‍රදර්ශනයේදී සිතියම් විකිණීමෙන් රු **544,501.00** වාර්තාගත ආදායමක් ලබා ගැනීමට හැකි විය.

## භූ ලක්ෂණාත්මක සිතියම් ඇඳීම් ඒකකය මගින් නිම කරන ලද කාර්යයන්

- 1:50,000 සිතියම් පත්‍ර මත ආරක්ෂක හමුදා ඉල්ලීම මත ඛණ්ඩාංක රේඛා මුද්‍රණය කර දෙන ලදී.ඒ අනුව 1: 50,000 පත්‍ර 46 ක ඛණ්ඩාංක රේඛා මුද්‍රණය කර භාර දී ඇත.මෙහි සම්පූර්ණ වටිනාකම රු.**2, 730,000/=** විය.
- 1:250000 පරිමාණයේ (කොටස් 4 සිතියම) ශ්‍රී ලංකා සිතියම (සිංහල) සංඛ්‍යාංක දත්ත ආශ්‍රයෙන් නිමකර ලිතෝ මුද්‍රණය සිදුකර ඇත. එම සිතියම 1 : 200 000 පරිමාණයෙන්ද නිම කර ඇත.
- 1:50000 පරිමාණයේ භූලක්ෂණාත්මක සිතියම් පත්‍ර නව සිතියම් මාලාවක් ලෙස එළිදැක්වීමට කටයුතු කරන ලදී.එහි ආරම්භයක් ලෙස මේ වන විට පත්‍ර අංක 9,31,26 එළි දක්වා ඇත.ඊට අමතරව පැරණි 1:50000 සිතියම් මාලාවේ සිතියම් පත්‍ර 11 ක් පැරණි දත්ත භාවිතා කර නැවත මුද්‍රණය සඳහා සකස් කරන ලදී. එම පත්‍ර අංක නම් 51,49,66,53,75,79,69,10,68,52,62 වේ.
- භූ ලක්ෂණාත්මක සිතියම් අංශයේ නිම කරන ලද සිතියම් අතර පාසල් සිසුන් ගේ භාවිතයට අවශ්‍ය 1:50,000 පත්‍ර කොටස් 5 ක වැඩ අවසන් කර ඇත.ඒවා නම් **76,42,31,54,55**වේ. සිංහල/දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් සකස් කරන ලදී.
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තු අවශ්‍යතාව මත ගාල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ තොරතුරු යථාවත් කර අදාල දත්ත අප දෙපාර්තමේන්තුව වෙත ලබාදී එහි සිතියම් සකස් කිරීම සිදුකරන ලදී.ඒ අනුව 1:10,000 පරිමාණයට සිතියම් පත්‍ර 53ක් සකස් කරන ලදී.මෙහි මූලික අදියර වශයෙන් එම දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් දිවයින පුරා පළාත් මට්ටමින් ක්‍රියාවට නංවන ලද්දේ එම ආයතනයේ ඉල්ලීම මතය.

## තේමා සිතියම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්

- තේමා සිතියම් අංශය මගින් 2015 වසරේ දිස්ත්‍රික් සිතියම් 25 ම සකස්කර අවසන් කර ඇති අතර මාර්ග සිතියමේ ඉංග්‍රීසි හා දෙමළ මුද්‍රණ යථාවත් කර නැවත මුද්‍රණය කරන ලදී.වනජීවී දෙපාර්තමේන්තුවේද පූර්ණ සහයෝගය ඇතිව යාල වනෝද්‍යාන සිතියම සකස් කරන ලදී.
- පාසල් සිතියම් සංග්‍රහයේ සිංහල සංස්කරණය නිම කර ඇති අතර මේ වන විට රජයේ මුද්‍රණාලය වෙත මුද්‍රණ සඳහා භාර දී ඇත. ජාතික අධ්‍යාපන ආයතනය සමග ඇති කරගත් එකඟතාවයක් මත පිටපත් 10,000 ක් ඔවුන් වෙත ලබාදීමට හා පිටපත් 2000 ක් විකිණීම සඳහා යනුවෙන් සම්පූර්ණ පිටපත් 12000 ක් මුද්‍රණය කරනු ඇත.දෙමළ පරිවර්තනයේ කටයුතු දැනට කෙරෙමින් පවතින අතර 2016 වසරේ මුද්‍රණය කර අවසන් කිරීමට හැකිවනු ඇත.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ ඇති කරගත් එකඟතාවය මත නගර සිතියම් 17 ක් සකස් කල යුතුව ඇති අතර ඉන් 6ක් මේ වන විට සකස් කර අවසන් කර ඇත.ඒවා පිළිවෙලින් අනුරාධපුර,පෑලියගොඩ,වත්තල මාබෝල,ගාල්ල,නුවර හා කුරුණෑගල යන නගර සිතියම් වේ.
- වනජීවී දෙපාර්තමේන්තුවේද අනුග්‍රහය සහිතව යාල වනෝද්‍යානය තුල සියලු තොරතුරු යථාවත් කර එම දත්ත භාවිතා කර යාල වනෝද්‍යානයේ සිතියම සකස් කර ඇත. එහි මුද්‍රිත පිටපත් මේ වන විට නිකුත් කර ඇත.
- කොළඹ නගරය දැක්වෙන සිතියම අඩි 8 X 5 ප්‍රමාණයට සකස් කර පාරිභෝගිකයන් වෙත නිකුත් කෙරේ.

### භූ ලක්ෂණාත්මක සිතියම් සැකසුම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්

- 1:10000 පරිමාණයේ භූලක්ෂණාත්මක සිතියම් පත්‍ර **92** ක් ක්ෂේත්‍රයට යවා පුනරීක්ෂණය කර එහි දත්ත පද්ධතිය යථාවත් කරන ලදී.


### විශේෂ සිතියම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්

- පාරිභෝගික ඉල්ලීම මත සකස් කරනු සිතියම් විකිණීමෙන් සැලකිය යුතු ආදායමක් දෙපාර්තමේන්තුව උපයන අතර 2015 වසරේදී එම සිතියම් ප්‍රමාණය **531**ක් පමණ වේ.

## 2015 වර්ෂය තුළ ප්‍රගතිය

පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී එක් එක් අංශ වල ප්‍රගතියේ ප්‍රතිශතයන් පහත රූප සටහනේ දැක්වේ.

**2015 වර්ෂය තුළ ප්‍රගතිය**




**2014/2015** වසර තුළදී සිතියම් නිෂ්පාදනයේ ප්‍රගතිය පහත දක්වා ඇත.

| සිතියම් වර්ගය | ඒකක | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|
| | | 2015 | | |
| | | වාර්ෂික ඉලක්කය | ලබාගත් ප්‍රගතිය | ඉලක්කයට අනුරූප ප්‍රතිශතය % |
| භූ ලක්ෂණාත්මක සිතියම් (ඇඳීම්) | සිතියම් ගණන | 315 | 228 | 72.36 |
| විශේෂ සිතියම් | සිතියම් ගණන | 500 | 531 | 106.2 |
| තේමා සිතියම් | සිතියම් ගණන | 77 | 28 | 36.36 |
| භූ ලක්ෂණාත්මක සිතියම් (සැකසුම්) | සිතියම් ගණන | 147 | 92 | 62.59 |

| සිතියම් වර්ගය | ඒකක | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|
| | | 2014 | | |
| | | වාර්ෂික ඉලක්කය | ලබාගත් ප්‍රගතිය | ඉලක්කයට අනුරූප ප්‍රතිශතය % |
| භූ ලක්ෂණාත්මක සිතියම් (ඇඳීම්) | සිතියම් ගණන | 132 | 264 | 200 |
| විශේෂ සිතියම් | සිතියම් ගණන | 151 | 153 | 101.32 |
| තේමා සිතියම් | සිතියම් ගණන | 33 | 26 | 78.79 |
| භූ ලක්ෂණාත්මක සිතියම් (සැකසුම්) | සිතියම් ගණන | 299 | 285 | 95.32 |

**සිතියම්කරණ අංශය මගින් සිදු කරන ලද විශේෂිත කාර්යයන්**

- ප්‍රධාන කාර්යාලයේ ස්ථාන 3කින් මෙතෙක් පාරිභෝගිකයන් වෙත සිතියම් හා අංකිත දත්ත නිකුත් කරන ලද අතර පාරිභෝගිකයන් හට පහසුවක් වශයෙන්,එම සියලුම සේවාවන් එකම ස්ථානයකින් ඉටුකර ගැනීමට හැකිවන පරිදි පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී.

- රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, වෙනත් ආයතන හා පුද්ගලයන්ගේ ඉල්ලීම් මත 2015 වසරේදී නොමිලේ නිමකරදී ඇති සිතියම් ප්‍රමාණය **28** ක් පමණ වේ.

- ආරක්ෂක අංශ නිළධාරීන් හා විශ්ව විද්‍යාල සිසුන් සඳහා සිතියම් සැකසීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම් මෙම වසරේද සිදුකරන ලද අතර කණ්ඩායම් **11** ක් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වා ඇත.

## 6.4 භූගෝලීය නාම ශාඛාව

<u>කාර්ය භාරය</u>

ශ්‍රී ලාංකීය ජනතාවගේ සංස්කෘතික උරුමය හා බැඳුණු, ජාතික සමගියට අනුබලයක් වන,නිවැරැදි වූත්, නිශ්චිත වූත් භූගෝලීය නාම හා දත්ත පද්ධතියක් ප්‍රමිතකරණය තුළින් හඳුන්වා දීම.

<u>කාර්ය සාධනය</u>

- භූගෝලීය නාම ප්‍රමිතකරණය හා රෝමානුකරණ ක්‍රමවේදයක් සැකසීම සඳහා ජාතික මට්ටමේ කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර ඇත.එම කමිටුව 2015 වසර තුළදී රැස්වීම් වාර 10ක් පවත්වා ඇත.

- අදාළ කමිටුව විසින් භූගෝලීය නාම ප්‍රමිතකරණය කිරීමේ මූලධර්ම,ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙල සකස් කර ඇත.

- භූගෝලීය නාම ප්‍රමිතකරණය සඳහා අවශ්‍ය කරනු ලබන මූලික දත්ත ප්‍රභවයන් හඳුනාගෙන ඇති අතර ඒ අතරින් ප්‍රධාන වශයෙන් පවතින 1:10,000 සිතියම් ශ්‍රේණියේ ඇති භූගෝලීය නාම 83,225 ක් ද,1:50,000 සිතියම් ශ්‍රේණියේ ඇති භූගෝලීය නාම 50,618 ක් ද,සිංහල මාධ්‍යට පරිවර්තනය කරන ලදී.තවද අනෙකුත් ආයතන සතුව ඇති හඳුනාගත් දත්ත ප්‍රභවයන් ද එක්රැස් කර ඇත.

- භූගෝලීය නාම ප්‍රමිතකරණ ක්‍රමවේදය හඳුනාගැනීමට හා ඒ සඳහා ගත වන කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පදනම් කරගෙන නියමු ව්‍යාපෘතියක් පවත්වන ලදී.ඒ අනුව මේ වන විට එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තොරතුරු රැස් කිරීම අවසන් කර ඇත.එම තොරතුරු මේ වන විට විශ්ලේෂණය කෙරෙමින් පවතී.

## 6.5 ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය

<u>කාර්ය භාරය</u>

**අවකාශීය දත්ත හා තොරතුරු පොදුවේ භාවිත කිරීම හා හුවමාරු කිරීම සඳහා විධිමත් ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම.**

<u>කාර්ය සාධනය</u>

ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය සඳහා වන නියාමන කමිටුවේ මඟපෙන්වීම අනුව කටයුතු කරමින් විවිධ ආයතන සතුව පවතින අවකාශීය දත්ත පිළිබඳ තොරතුරු එම ආයතන විසින් දත්ත පද්ධතියකට ඇතුළත් කිරීමට හැකිවනු පිණිස හා එම තොරතුරු දත්ත පරිහරණය කරන්නන් හට බලාගැනීමට හැකිවනු පිණිසත් වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන ආයතනය හා එක්ව කටයුතු කරමින් සිටී.

## 6.6 ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිති අංශය

බොහෝ පැරණි පිඹුරු මෙම ශාඛාවේ සුරක්ෂිතව තබා ඇති අතර, මහජනයා විසින් කරනු ලබන ඉල්ලීම් අනුව ඒවායේ උධෘත සැපයේ. එමෙන්ම ක්ෂේත්‍රයේ සිදු කරන මැනුම් සඳහා පිළියෙල කරන සියළු ව්‍යවස්ථාපිත පිඹුරුවල සහතික පිටපතක් මෙම ශාඛාවෙහි ගොණු කරන අතර, පසුව කෙරෙන මැනුම්වලින් එම පිඹුරු යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලබයි. එසේම ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සඳහා අවසාන ගම් පිඹුරු සැකසීමද මෙම අංශයෙන් සිදු කෙරේ. වෘත්තීය ප්‍රමිතීන්ට අදාලව ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා ප්‍රතීතන සහතික නිකුත්කිරීමද සිදු කරනු ඇත. 2015 වසර තුලදී මෙම ශාඛාවේ ප්‍රගතිය පහත පරිදි වේ.

### 6.6.1 හිමිකම් පිඹුරු පිටපත් නිකුත් කිරීම

හිමිකම් පිඹුරු හා වෙනත් පිඹුරුවල නිකුත් කරන ලද පිටපත් ගණන - 2893
මෙම පිටපත් නිකුත් කිරීමෙන් රු. 1,273,490.00ක මුදලක් උපයා ඇත.

### 6.6.2 දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මගින් නිකුත් කරන ලද පිඹුරු අනුරේඛණ හා රේඛා චිත්‍ර

| | | |
|---|---|---|
| නිකුත් කරන ලද නිරවුල් කිරීමේ රේඛා චිත්‍ර ගණන | - | 665 |
| නිකුත් කරන ලද රේඛා චිත්‍ර ගණන (O සහ V) | - | 1211 |
| බදු රේඛා චිත්‍ර ගණන (L රේඛා චිත්‍ර) | - | 710 |
| මහජනයාට නිකුත් කරන ලද අනුරේඛණ ගණන | - | 6768 |
| මහජනයාට නිකුත් කල සත්‍ය ඡායා පිටපත්ගණන | - | 19,121 |
| ඉ .සං. ආ. යටතේ නිකුත් කර ඇති රේඛා චිත්‍ර ගණන | - | 21,944 |

### 6.6.3 උසාවි කොමිෂන් මැනුම්

| | | |
|---|---|---|
| පසුගිය වසරෙන් ඉදිරියට ගෙනා උසාවි කොමිෂන් සංඛ්‍යාව | - | 556 |
| වසර තුල ලැබුන උසාවි කොමිෂන් සංඛ්‍යාව | - | 455 |
| වැඩ නිමකර උසාවිවලට යැවූ සංඛ්‍යාව | - | 592 |
| වසර අගදී ඉතිරි සංඛ්‍යාව | - | 419 |

### 6.6.4 ඉඩම් නිරවුල් කිරීමේ පනත යටතේ අවසාන ගම් පිඹුරු සහ අවසාන භූලක්ෂණාත්මක පිඹුරු සැකසීම

| | | |
|---|---|---|
| පසුගිය වසර අවසානයට ඉතිරිය | - | 53 |
| 2015 වසර තුලදී ලැබුණු ප්‍රමාණය | - | 11 |
| 2015 වසරේදී සකසා නිකුත් කරන ලද අවසාන ගම් පිඹුරු හා අවසාන භූලක්ෂණාත්මක පිඹුරු සංඛ්‍යාව | - | 52 |
| 2015 වසර අවසානයට ඉතිරිය | - | 12 |

### 6.6.5 පැරණි ලේඛණ අලුතින් පිළියෙල කරන ලද පිඹුරු අනුව යාවත්කාලීන කිරීම

| | | |
|---|---|---|
| පසුගිය වසර අවසානයේ යාවත්කාලීන කිරීමට ඉතිරි පිඹුරු ගණන | - | 916 |
| 2015 වසර තුලදී ලැබුණු ප්‍රමාණය | - | 7,717 |
| 2015 දී, යාවත්කාලීන කරන ලද පැරණි මූලික පිඹුරු ගණන | - | 1,341 |
| අවසාන ගම් පිඹුරු හා අවසාන භූලක්ෂණාත්මක පිඹුරු ගණන | - | 2,158 |
| භූලක්ෂණාත්මක මූලික පිඹුරු සහ ගම් පිඹුරු ගණන | - | 413 |
| කැඩැස්තර සිතියම් ගණන | - | 3,540 |
| වසර අවසානයේ ඉතිරි පිඹුරු ප්‍රමාණය | - | 265 |

### 6.6.6 පැරණි පිඹුරු සංරක්ෂණය

පැරණි පිඹුරු සංරක්ෂණය කිරීමේ වැඩ සටහන යටතේ එම පිඹුරු පරිලෝකනය (Scan) කර සංගත තැටි ලෙස ගබඩා කිරීම 2004 වසරේදී ආරම්භ කරන ලදී.

ඒ අනුව ප්‍රගතිය පහත සඳහන් වේ.

| වර්ගය | නිම කිරීමට ඇති පිඹුරු ප්‍රමාණය | 2014-12-31තෙක් නිම කල ප්‍රමාණය | 2015 වසරේ නිම කල ප්‍රමාණය | ඉතිරිය |
|---|---|---|---|---|
| හිමිකම් පිඹුරු | 461,558 | 161,081 | 29,969 | 270,508 |
| ක්ෂෙත්‍ර පත්‍ර | 71,425 | 40,703 | 23,728 | 6,994 |
| මූලික පිඹුරු | 100,626 | 12,467 | 16,917 | 71,242 |

### 6.6.7 මැනුම් සඳහා අවශ්‍ය විස්තර සැපයීම (L96) - කැබලි **5,571**

### 6.6.8 ප්‍රතීතන සහතික නිකුත් කිරීම

1998 හිමිකම්, ලියාපදිංචි කිරීමේ පනත යටතේ කඩඉම් මැනුම් කටයුතු කිරීමට බලාපොරොත්තු වන ලියාපදිංචි මිනින්දෝරුවන් සඳහා කඩඉම් මැනුම්කරණය කර ගෙන යාම පිළිබඳ ඒ ඒ මිනින්දෝරුවරයාගේ නිපුණතාවය සම්බන්ධයෙන් ප්‍රතීතන සහතිකයක් නිකුත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| 2015.12.31 දිනට ලියාපදිංචි මිනින්දෝරුවරුන් සංඛ්‍යාව | - | 2,078 |
| 2014.12.31 දිනට ප්‍රතීතන සහතික ලබා ගෙන ඇති සංඛ්‍යාව | - | 1,472 |
| 2015 දී ලබා ගෙන ඇති ප්‍රමාණය | - | 76 |
| 2015.12.31 දිනට ප්‍රතීතන සහතික ලබා ගෙන ඇති මුළු සංඛ්‍යාව | - | 1,548 |

## 7.0 ඉඩම් තොරතුරු පද්ධති/ භූගෝලීය තොරතුරු පද්ධති අංශය

### 7.1 ගුවන් මැනුම් හා ඡායා රේඛනමිතික අංශය

<u>කාර්ය භාරය</u>

සිතියම්කරණය සහ සංවර්ධන සැලසුම් සඳහා අවශ්‍ය වන ගුවන් ඡායාරූප භාවිත කර දත්ත උකහා ගැනීම.

<u>කාර්ය සාධනය</u>

- 1:10,000 ආංකික දත්ත සිතියම් 163 ක් ආවරණය වන සේ වර්ග කි.මී. 6345 ක භූමි ප්‍රමාණයක් ද්වීමාන දත්ත ලෙසද,වර්ග කි.මී.236 ක ප්‍රමාණයක් ත්‍රිමාණ දත්ත ලෙසද ආංකික දත්ත උපුටා ගන්නා ලදී.ඒ අනුව සිතියම් 1834 කින් සමන්විත 1:10,000 සිතියම් ශ්‍රේණිය සඳහා ආංකික දත්ත උපුටා ගැනීම් 2015 වසරේදී අවසන් කරන ලදී.

- ගුවන් ඡායාරූප ස්පර්ශ මුද්‍රණ ඒකක 264 ක් හා ගුවන් ඡායාරූප පරිලෝකන ඒකක 1001 ක් අවසන් කර ඇත.

- 1:5,000 නගර සිතියම් සඳහා ආංකික දත්ත වර්ග කි.මී.252 ක ප්‍රමාණයක් රැස්කර ඇත.

## 7.2 දුරස්ථ ග්‍රහණ අංශය

කාර්යභාරය

චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි 1:50,000හූ ලක්ෂණාත්මක ආංකික දත්ත පද්ධතියක් සකසා යථාවත් කිරීම,1:50,000 සිතියම් ශ්‍රේණිය සඳහා ආංකික දත්ත සැපයීම හා වෙනත් ආයතනවල අවශ්‍යතාවයන් අනුව චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණය කර ආංකික දත්ත සැකසීම.

කාර්ය සාධනය

- අධි විභේදන චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර 1:50,000 පරිමාණයේ නව භූ ලක්ෂණාත්මක දත්ත පද්ධතියක් සැකසීම සඳහා නව වැඩ සටහනක් හඳුන්වා දෙන ලදී.ඒ අනුව මුළු ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි එම දත්ත පද්ධතිය 2017 වසර අවසාන වන විට නිමකිරීමට සැළසුම් කර ඇත.ඒ අනුව පත්‍ර 05 ක කටයුතු 2015 වසරේදී නිමකරන ලදී.
- පෙර පැවති වැඩ සටහන අනුව අධි විභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර ක්ෂෙත්‍ර විමර්ෂණයකින් තොරව පත්‍ර 09 ක් සඳහා දත්ත රැස්කරන ලදී.ඒ අනුව පැරණි වැඩ සටහන යටතේ 2015 වසර අවසාන වන විට පත්‍ර 56 කට කටයුතු නිමකර ඇත.
- 2014 වසරේදී UNREDD ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් සඳහා ආංකික දත්ත බවට පත් කළ 1:100,000 පරිමාණයෙන් යුක්ත වූ 1985 වසරට අදාළ ඉඩම් පරිහරණ දත්ත එම ව්‍යාපෘතියේම අවශ්‍යතාවය අනුව 2000 වසරට අදාළ LANDSAT චන්ද්‍රිකා ඡායාරූප භාවිතා කර යාවත්කාලීන කිරීම සිදුකරන ලදී.
- යෝජිත මඩකලපුව අභ්‍යාන්තර ගුවන් තොටුපළට අදාළ නියාමන කටයුතු සඳහා එහි ආරක්ෂිත ප්‍රදේශයේ භූ ලක්ෂණාත්මක බණ්ඩාංක සහ ග්‍රාම නිලධාරී වසම් විස්තර ඇතුළත් සිතියමක් පිළියෙල කර සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත ලබාදෙන ලදී.

01. ජපාන රජය සමඟ ක්‍රියාත්මක කරනු ලබන LiDAR තාක්ෂණය ලබා ගැනීමේ ව්‍යාපෘතිය

කාර්යභාරය

LiDAR තාක්ෂණය ශ්‍රී ලංකාවට හඳුන්වා දීම,වර්ග කි.මී. 7800 ක ප්‍රදේශයක් ආවරණය වන සේ ආංකික උන්නතාංශ පද්ධතියක් පිහිටු වීමෙන් ආපදා කළමනාකරණය සඳහා සහය ලබාදීම හා අදාළ මෘදුකාංග හා දෘඩාංග ලබාදීම.

කාර්ය සාධනය

- ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය සමඟ අත්සන් කරන ලද ගිවිසුම අනුව වසර 02 ක කාල පරිච්ඡේදයක් සහිත ව්‍යාපෘතිය 2015 වසරේදී ආරම්භ කරන ලදී.
- ව්‍යාපෘතිය යටතේ සැපයීමට නියමිත මෘදුකාංග හාදෘඩාංගවලින් කොටසක් 2015 වසරේදී සපයන ලදී.
- LiDAR තාක්ෂණය සඳහා අදාළ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ කටයුතු ජපාන උපදේශකවරුන් විසින් ක්‍රියාත්මක කර ඇත.
- ව්‍යාපෘතිය යටතේ LiDAR නිරීක්ෂණ ගැනීමට හා ගුවන් ඡායාරූප ගැනීමට අවශ්‍ය කරනු ලබන ගුවන් යානය හා උපකරණ භාවිතාකර නිරීක්ෂණ ගැනීම ආරම්භ කරන ලදී.

## 7.3 භූගෝලීය තොරතුරු පද්ධති අංශය

කාර්යභාරය

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි විවිධ පරිමාණයෙන් යුත් භූගෝලීය තොරතුරු පද්ධති සැකසීම හා වෙනත් ආයතනවල අවශ්‍යතාවයන් අනුව භූගෝලීය තොරතුරු විශ්ලේෂණය කර සැපයීම.

කාර්ය සාධනය

- 1:10,000 පරිමාණයේ භූ ලක්ෂණාත්මක පත්‍ර 286 ක දත්ත ආංකික දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත.ඒ අනුව පත්‍ර 1834 කින් සමන්විත වන 1:10,000 භූ ලක්ෂණාත්මක දත්ත පද්ධතිය මඟින් මුළු ශ්‍රී ලංකාවම ආවරණය වේ. (ඇමුණුම 9 බලන්න).
- ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව 1:5,000 පරිමාණයෙන් ප්‍රධාන නගර 17ක පරිපාලන ප්‍රදේශ ආවරණය වන පරිදි භූ ලක්ෂණාත්මක දත්ත නිපදවා භාරදෙන ලදී.
- වකුගඩු රෝගීන්ගේ ව්‍යාප්තිය සම්බන්ධව දත්ත සැකසීම හා විශ්ලේෂණය කිරීම කර කැබිතිගොල්ලෑව,මැදිරිගිරිය,ඇලහැර,දිඹුලාගල,රඹෑවැව,කහටගස්දිගිලිය,හිඟුරක්ගොඩ සහ හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අදාළ ප්‍රදේශ සඳහා සිතියම් සකසා ජනාධිපති කාර්යාලයේ ස්ථාපිත විශේෂ ඒකකයට භාරදෙන ලදී.

## 7.4 ඉඩම් තොරතුරු පද්ධති අංශය

- 2015 වර්ෂයේදී කඩඉම් පිඹුරු කලාප 600 ක් ඉඩම් තොරතුරු පද්ධතියට පරිවර්තනය කර ඇති අතර ඉඩම් කැබලි 98,476 ක් ද පරිවර්තනය කර ඇත.
- ඒ අනුව මේ වන තෙක් ඉඩම් තොරතුරු පද්ධතියට කඩඉම් පිඹුරු කලාප 4,833 ක් සහ ඉඩම් කැබලි 922,774ක් පරිවර්තනය කර ඇත.
- ඉඩම් තොරතුරු පද්ධතිය සඳහා ආංකික දත්ත සැපයීමේ ගුණාත්මක බව වැඩිකිරීමට හාදෝෂ අවම කර ගැනීම උදෙසා මිනින්දෝරු සේවයේ සියළුම ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහභාගි වන පරිදි පළාත් මට්ටමින් වැඩමුළු පවත්වන ලදී.
- ඉඩම් තොරතුරු පද්ධතිය භාවිතය හා ව්‍යාප්තිය සම්බන්ධයෙන් ESRI-GIS Solution Pvt(Ltd.) ආයතනය සමඟ සම්බන්ධ වී පාරිභෝගික ආයතන දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුවක් සර්වෙයර් ජනරාල් කාර්යාලයේදී පැවැත්වීය.
- සීමා මායිම් නිර්ණය කිරීමේ කමිටුව ලබාදෙන ලද තොරතුරු අනුව පිළියෙල කරණ ලද පළාත් පාලන කොට්ඨාශ මායිම් සහිත සිතියම් වෙබ් අඩවිගත කරන ලදී.

## 8.0 මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව

**හැඳින්වීම :**

2015 වාර්ෂික වැඩසටහන අනුව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය විසින් සිය වැඩසටහන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පූර්ණ අධ්‍යාපනික ශක්‍යතාවයන් සපුරා ගැනීමට හැකිවන අයුරින් මැනුම් හා සිතියම්කරණ විෂයෙහිලා උසස් ගුණාත්මක අධ්‍යාපනික පළපුරුද්ද ලබා දීමේ මෙහෙවර ඉටු කරනු ලැබ ඇත. මෙම ආයතනයෙන් උපාධි පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම, මිනින්දෝරුවරුන්, සිතියම් තාක්ෂණ නිලධාරීන්, ඡායාරේඛණමිතික තාක්ෂණ නිලධාරීන්, ගුවන් ඡායාරූපකරණ තාක්ෂණ නිලධාරීන්, දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරීන් හා අනෙකුත් තාක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම සිදු කෙරේ. මෙම ආයතනය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මැනුම්පති (පුහුණු) /අධ්‍යක්ෂ (මැ.සි.ආ.) යටතේ පාලනය වේ.

නියෝජ්‍ය මැනුම්පති (අධ්‍යයන) යටතේ දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා නිශ්චිත පාඨමාලා මෙම ආයතනය තුළ පැවැත්වේ.

## 8.1 ආයතනය වසර තුළ පවත්වන ලද පාඨමාලා

### 8.1.1 වසර තුළ පවත්වන ලද නිශ්චිත පාඨමාලා

| අනු අංකය | පාඨමාලාවේ නම | කාලය | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය/අවසන් කිරීමට නියමිත දිනය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | මැනුම් විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව - 12 (බී.ඩී.සී. 12) | වසර 04 යි | 2011-10-03 | 2015-10-02 | 108 |
| 2 | මැනුම් විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව - 14 (බී.ඩී.සී. 14) | වසර 04 යි | 2014-10-07 | 2018-10-06 | 91 |
| 3 | මැනුම් විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (දුරස්ථ අධ්‍යයන) - 29 (එච්.ඩී.සී. 29) | වසර 1 1/2 | 2014-02-10 | 2015-07-25 | 53 |
| 4 | මැනුම් විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (නේවාසික) - 30 (එච්.ඩී.සී. 30) | වසර 1 | 2014-05-05 | 2015-05-04 | 5 |
| 5 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සඳහා ඩිප්ලෝමා පාඨමාලාව (උසස් පෙළ) - 6 A (එස්.එල්.ටී.එස්. 6 A) | වසර 2 (වසරක ක්ෂේත්‍ර පුහුණුව ඇතුලත්ව) | 2013-03-04 | 2015-03-03 | 41 |
| 6 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සඳහා ඩිප්ලෝමා පාඨමාලාව (උසස් පෙළ) - 6 B (එස්.එල්.ටී.එස්. 6 B) | වසර 2 (වසරක ක්ෂේත්‍ර පුහුණුව ඇතුලත්ව) | 2013-03-04 | 2015-03-03 | 39 |
| 7 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සඳහා ඩිප්ලෝමා පාඨමාලාව (උසස් පෙළ) - 7 A (එස්.එල්.ටී.එස්. 7 A) | වසර 2 (වසරක ක්ෂේත්‍ර පුහුණුව ඇතුලත්ව) | 2014-03-03 | 2016-03-02 | 74 |
| 8 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය සඳහා ඩිප්ලෝමා පාඨමාලාව (උසස් පෙළ) - 7 B (එස්.එල්.ටී.එස්. 7 B) | වසර 2 (වසරක ක්ෂේත්‍ර පුහුණුව ඇතුලත්ව) | 2015-03-02 | 2016-03-01 | 64 |

### 8.1.2 වෙනත් ආයතන සඳහා වසර තුළ පැවැත් වූ කෙටි කාලීන පාඨමාලා

| | Course description | No. of participants | Duration | Organization |
|---|---|---|---|---|
| 1 | එක්දින පුහුණු වැඩමුළුව | 05 | 2015.01.10 | ශ්‍රී ලංකා යුධ හමුදා විද්‍යාලය - දියතලාව - ශ්‍රී ලංකා යුධ හමුදාව |
| 2 | එක්දින පුහුණු වැඩමුළුව | 22 | 2015.01.20 | නාවික සහ සමුද්‍රීය විද්‍යාපීඨය - ශ්‍රී ලංකා නාවික හමුදාව |
| 3 | එක්දින පුහුණු වැඩමුළුව | 15 | 2015.01.28 | ශ්‍රී ලංකා ගුවන් හමුදා යුධ පාසල - දියතලාව |
| 4 | එක්දින පුහුණු වැඩමුළුව | 81 | 2015.01.28 | කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල - ඌව කුඩා ඔය |
| 5 | තලමිතිය සහ GPS පිළිබඳ පුහුණු සැසිය | 31 | 2015.02.09-2015.02.12 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල |
| 6 | එක්දින පුහුණු වැඩමුළුව | 79 | 2015.02.24 | කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල - ඌව කුඩා ඔය |
| 7 | GPS පිළිබඳ පුහුණු සැසිය | 12 | 2015.02.26 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා - මොණරාගල |
| 8 | එක්දින පුහුණු වැඩමුළුව | 33 | 2015.02.26 | බප/කැලණිය/හේනේගම ජාතික පාසල - කැලණිය |

| | | | | |
|---|---|---|---|---|
| 9 | එක්දින පුහුණු වැඩමුළුව | 64 | 2015.02.27 | දේවි බාලිකා විද්‍යාලය - කොළඹ 08 |
| 10 | ක්ෂෙත්‍ර මැනුම් සහායකයින් සඳහා පුහුණු වැඩ සටහන -2015 (NVQ Level 2/3/4) – 2 කණ්ඩායම | 105 | 2015.02.16 - 2015.02.27 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| 11 | එක්දින පුහුණු කඳවුර | 80 | 2015.03.04 | බ / විශාඛා විද්‍යාලය -බණ්ඩාරවෙල |
| 12 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් 01 | 39 | 2015.03.10 | මො/දුටුගැමුණු ම.ම.වි. සහ මො/මලත්තාවල විද්‍යාලය |
| 13 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් - 02 | 41 | 2015.03.12 | බ /මීගකිවුල ජාතික පාසල, බ/පස්සර ජාතික පාසල සහ බ /මහියංගනය ජාතික පාසල |
| 14 | ක්ෂෙත්‍ර මැනුම් සහායකයින් සඳහා පුහුණු වැඩ සටහන -2015 (NVQ Level 2/3/4) – 3 කණ්ඩායම | 96 | 2015.03.16 - 2015.03.27 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| 15 | එක්දින පුහුණු වැඩමුළුව | 10 | 2015.03.12 - 2015.03.13 | ශ්‍රී ලංකා ගුවන් හමුදා යුධ පාසල - දියතලාව |
| 16 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් 03 | 38 | 2015.03.17 | මො/නිශ්ශංක ජාතික පාසල සහ මො/මහානාම ජාතික පාසල |
| 17 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් 04 | 44 | 2015.03.19 | මො/ ජාතික පාසල සහ මො/මැදගම ජාතික පාසල |
| 18 | එක්දින පුහුණු වැඩමුළුව | 88 | 2015.03.20 | කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල - ඌව කුඩා ඔය |
| 19 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් 05 | 61 | 2015.03.24 | පස්සර දෙමළ මහා විද්‍යාලය සහ BD/බදුල්ල මධ්‍ය මහා විද්‍යාලය |
| 20 | එක්දින පුහුණු වැඩමුළුව | 84 | 2015.03.26 | කමාන්ඩෝරෙජිමේන්තු පුහුණු පාසල - ඌව කුඩා ඔය |
| 21 | ක්ෂෙත්‍ර මැනුම් සහායකයින් සඳහා පුහුණු වැඩ සටහන -2015 (NVQ Level 2/3/4) 4 කණ්ඩායම (ත්‍රිකුණාමලය) | 99 | 2015.03.30 - 2015.04.08 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| 22 | ක්ෂෙත්‍ර මැනුම් සහායකයින් සඳහා පුහුණු වැඩ සටහන -2015 (NVQ Level 2/3/4) - 5 කණ්ඩායම (කන්තලේ) | 109 | 2015.03.30 - 2015.04.08 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| 23 | එක්දින පුහුණු කඳවුර | 52 | 2015.04.02 | ගා/ නෙළුව ජාතික පාසල - නෙළුව |
| 24 | එක්දින පුහුණු කඳවුර | 78 | 2015.04.27 | කමාන්ඩෝරෙජිමේන්තු පුහුණු පාසල- ඌව කුඩා ඔය |
| 25 | එක්දින පුහුණු කඳවුර | 23 | 2015.04.29 | බ/ ධර්මපාල නවෝද්‍යා විද්‍යාලය - බණ්ඩාරවෙල |
| 26 | එක්දින පුහුණු කඳවුර | 54 | 2015.04.30 | බ / ධර්මාශෝක මධ්‍ය මහා විද්‍යාලය - බණ්ඩාරවෙල |
| 27 | එක්දින පුහුණු කඳවුර | 20 | 2015.05.06 | ශ්‍රී ලංකා ගුවන් හමුදා යුධ පාසල - දියතලාව |
| 28 | ක්ෂෙත්‍ර මැනුම් සහායකයින් සඳහා පුහුණු වැඩ සටහන -2015 (NVQ Level 2/3/4) - 6 කණ්ඩායම | 46 | 2015.05.11 - 2015.05.22 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| 29 | මැනුම් පුහුණු කඳවුර | 125 | 2015.05.11 - 2015.05.22 | මොරටුව විශ්ව විද්‍යාලය - සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව |
| 30 | එක්දින පුහුණු වැඩමුළුව | 70 | 2015.05.21 | කමාන්ඩෝරෙජිමේන්තු පුහුණු පාසල- ඌව කුඩා ඔය |
| 31 | එක්දින පුහුණු කඳවුර | 60 | 2015.05.27 | ර/ ශ්‍රී බුද්ධ ජයන්ති ජාතික පාසල - බලංගොඩ |
| 32 | මැනුම් පුහුණු කඳවුර | 92 | 2015.06.08 - 2015.06.13 | HNDE - මට්ටක්කුලිය |
| 33 | ක්ෂෙත්‍ර මැනුම් සහායකයින් සඳහා පුහුණු වැඩ සටහන -2015 (NVQ Level 2/3/4) - 7 කණ්ඩායම | 61 | 2015.06.15 - 2015.06.26 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| 34 | එක්දින පුහුණු වැඩමුළුව | 19 | 2015.06.08 - 2015.06.09 | ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය - කොළඹ |
| 35 | එක්දින පුහුණු වැඩමුළුව | 65 | 2015.06.24 | ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය - කොළඹ |
| 36 | එක්දින පුහුණු වැඩමුළුව | 31 | 2015.06.25 | තාක්ෂණික විද්‍යාලය - ඇඹිලිපිටිය |

| | | | | |
|---|---|---|---|---|
| 37 | එක්දින පුහුණු කඳවුර | 11 | 2015.06.30 | බ/ වල්හපුතැන්න ජාතික පාසල - හල්දුම්මුල්ල සහ බ/ කැප්පිටිපොල මහා විද්‍යාලය - කැප්පිටිපොල |
| 38 | එක්දින පුහුණු කඳවුර | 54 | 2015.07.02 | බ/ බෝරලන්ද ධර්මපාල මහා විද්‍යාලය - බෝරලන්ද |
| 39 | එක්දින පුහුණු කඳවුර | 50 | 2015.07.04 | දොන් බොස්කෝ පුහුණු ආයතනය - මැටියගනේ |
| 40 | එක්දින පුහුණු වැඩමුළුව | 45 | 2015.07.28 | තාක්ෂණික විද්‍යාලය - මාතර |
| 41 | එක්දින පුහුණු වැඩමුළුව | 34 | 2015.08.03 | ශ්‍රී ලංකා ගුවන් හමුදා යුධ පාසල - දියතලාව |
| 42 | එක්දින පුහුණු වැඩමුළුව | 25 | 2015.08.11 | නාවික සහ සමුද්‍රීය විද්‍යාපීඨය - ශ්‍රී ලංකා නාවික හමුදාව |
| 43 | මැනුම් පුහුණු කඳවුර | 116 | 2015.08.10 - 2015.08.15 | උසස් තාක්ෂණ විද්‍යායතනය - ගාල්ල සහ යාපනය |
| 44 | එක්දින පුහුණු වැඩමුළුව | 27 | 2015.08.31 | නාවික සහ සමුද්‍රීය විද්‍යාපීඨය - ශ්‍රී ලංකා නාවික හමුදාව |
| 45 | මැනුම් පුහුණු කඳවුර | 84 | 2015.09.07 - 2015.09.12 | ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක (A කණ්ඩායම) |
| 46 | මැනුම් පුහුණු කඳවුර | 84 | 2015.09.28 - 2015.10.03 | ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක ( B කණ්ඩායම) |
| 47 | එක්දින පුහුණු කඳවුර | 44 | 2015.10.05 | කෑ/මා/අල්- අසාර් මහා විද්‍යාලය - හෙම්මතගම |
| 48 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් 01 | 36 | 2015.10.06 | මො/ මොණරාගල ජාතික පාසල - මොණරාගල සහ බ/ මීගහකිවුල ජාතික පාසල - මීගහකිවුල |
| 49 | එක්දින පුහුණු කඳවුර | 41 | 2015.10.07 | ර/ දමහාන මහා විද්‍යාලය |
| 50 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් 02 | 54 | 2015.10.08 | බ/ කන්දෙගෙදර ජාතික පාසල & බ/ බදුල්ල ජාතික පාසල - බදුල්ල |
| 51 | එක්දින පුහුණු වැඩමුළුව | 35 | 2015.10.12 - 2015.10.16 | British College of Applied Studies - ගල්කිස්ස |
| 52 | තලමිතිය පිළිබඳ පුහුණු සැසිය | 22 | 2015.10.12 - 2015.11.03 | ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය - කොළඹ |
| 53 | එක්දින පුහුණු වැඩමුළුව | 19 | 2015.10.15 | කොතලාවල ආරක්ෂක විද්‍යාලය - සූරියවැව |
| 54 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් 03 | 27 | 2015.10.20 | මො/ මැදගම ජාතික පාසල - මැදගම |
| 55 | එක්දින පුහුණු වැඩමුළුව | 9 | 2015.10.21 | නාවික සහ සමුද්‍රීය විද්‍යාපීඨය - ශ්‍රී ලංකා නාවික හමුදාව |
| 56 | එක්දින පුහුණු කඳවුර | 16 | 2015.10.21 | බ/ ශ්‍රී දේවානන්ද ජාතික පාසල - මිර්හවත්ත |
| 57 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් 05 | 20 | 2015.10.29 | බ/පස්සර දෙමළ මහා විද්‍යාලය - පස්සර |
| 58 | එක්දින පුහුණු වැඩමුළුව | 18 | 2015.11.02 | ශ්‍රී ලංකා ගුවන් හමුදා යුධ පාසල - දියතලාව |
| 59 | එක්දින පුහුණු කඳවුර | 46 | 2015.11.04 | ර/බලංගොඩ ආනන්ද මෛත්‍රී මධ්‍ය මහා විද්‍යාලය - බලංගොඩ |
| 60 | එක්දින පුහුණු කඳවුර - තාක්ෂණ කණ්ඩායම් 04 | 20 | 2015.11.05 | බ/ජනාධිපති විද්‍යාලය - අඹගස්දූව |
| 61 | එක්දින පුහුණු වැඩමුළුව | 82 | 2015.11.06 | සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය - වේයන්ගොඩ |
| 62 | එක්දින පුහුණු වැඩමුළුව | 80 | 2015.11.27 | සබරගමුව විශ්ව විද්‍යාලය - බෙලිහුල්ඔය |
| 63 | එක්දින පුහුණු වැඩමුළුව | 72 | 2015.12.16 | ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය - කොළඹ |
| 64 | GPS පිළිබඳ පුහුණු සැසිය | 38 | 2015.12.21 - 2015.12.23 | ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය - බණ්ඩාරවෙල |

චාරිකා සඳහා කණ්ඩායම් 45 පැමිණ ඇති අතර, ඒ සඳහා 1988 දෙනෙකු සහභාගි වී ඇත.

## 9.0 විභාග අංශය

දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව පවත්වනු ලබන විභාග නියෝජ්‍ය මැනුම්පති (අධ්‍යයන) යටතේ ඇති විභාග අංශයෙන් ඉටු කරනු ලැබේ.

### විභාග අංශය විසින් 2015 වසර තුලදී පවත්වන ලද විභාග

| අනු අංකය | විභාගය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | සුදුසුකම් ලත් අයදුම්පත් සංඛ්‍යාව | විභාගය පැවැත්වූ /නියමිත වූ දිනයන් | පැමිණි සිටි සංඛ්‍යාව | ප්‍රතිඵල නිකුත් කළ දිනය | සමත් වූ සංඛ්‍යාව | ඌන සාමාර්ථ ලැබූ සංඛ්‍යාව | වියදම් වූ සම්පූර්ණ මුදල (රුපියල්) | එක් අපේක්ෂකයෙකු සඳහා වැය වූ මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මැනුම් උපකරණ කාර්මික ශිල්පීන් II වන පන්තියේ "ආ" ඛණ්ඩයේ සිට II වන පන්තියේ "අ" ඛණ්ඩයට උසස් කිරීමේ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය | 01 | 01 | 2015/04/28 | 01 | 2015/05/29 | 01 | 00 (අසමත්) | 4043.75 | 2022.00 |
| 2 | මැනුම් උපකරණ කාර්මික ශිල්පීන් I වන පන්තියේ සිට තේරීම් ශ්‍රේණියට උසස් කිරීම සඳහා පවත්වනු ලබන දෙපාර්තමේන්තු පරීක්ෂණය | 01 | 01 | 2015/04/28 | 01 | 2015/05/29 | 01 | 00 (අසමත්) | | |
| 3 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය *(වායුසමීකරණ ශිල්පී)* | 01 | 01 | 2015/04/29 | 01 | 2015/05/29 | 01 | 00 (අසමත්) | 5028.75 | 5028.75 |
| 4 | මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය *(දිස්ත්‍රික් මට්ටමින්)* | 210 | 185 | 2015/05/11-15 | 181 | 2015/06/29 | 170 | 11 | - | - |
| 5 | මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 68 | 58 | 2015/05/23 | 41 | 2015/06/29 | 13 | 28 | 2825.00 | 50.00 |
| 6 | මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය *(දිස්ත්‍රික් මට්ටමින්)* | 34 | 32 | 2015/05/25-29 | 30 | 2015/07 | 29 | 01 | - | - |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ II පන්තියේ "ආ" බණ්ඩයේ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය (ඡායාරේඛණමිතික තාක්ෂණ නිලධාරීන් සඳහා) | 05 | 05 | 2015/07/13-16,28 | 05 | 2015/11/03 | 00 | 05 | | |
| 8 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ II පන්තියේ "ආ" බණ්ඩයේ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය (සිතියම් තාක්ෂණ නිලධාරීන් සඳහා) | 71 | 68 | 2015/07/16-17 | 63 | 2015/11/03 | 26 | 37 | 66322.00 | 884.00 |
| 9 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ II පන්තියේ "ආ" බණ්ඩයේ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය (ගුවන්ඡායාරූප ශිල්පි සහ රසායනාගාර තාක්ෂණ නිලධාරීන් සඳහා) | 02 | 02 | 2015/07/13-16 | 02 | 2015/11/03 | 00 | 02 | | |
| 10 | බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - I කොටස *(2015 මැයි ගැසට් පත්‍රය)* | 247 | 125 | 2015/07/25 | 82 | 2015/01/01 | 21 | 61 (අසමත්) | 38217.00 | 306.00 |
| 11 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන්ගේ II පන්තියේ අ බණ්ඩයේ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය (සිතියම් තාක්ෂණ නිලධාරීන් සඳහා) | 18 | 11 | 2015/10/22-23 | 10 | 2015/12/21 | 06 | 04 | 12700.00 | 1155.00 |
| 12 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 125 | 121 | දෙසැම්බර් | - | විභාග දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඇත | | | | |
| 13 | බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - II කොටස (2015 මැයි ගැසට් පත්‍රය) | 21 | 21 | 2015/10/17-18 | 18 | 2015/12/22 | 01 | 17 (අසමත්) | 30875.00 | 1470.00 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 14 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය *(සිතියම් සවිකරන්නා හා පොත් බඳින්නා)* | 02 | 02 | 2015/10/20 | 02 | 2015/11/30 | 02 | 00 (අසමත්) | 3040.00 | 1520.00 |
| 15 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය *(වඩුකාර්මික ශිල්පී)* | 02 | 02 | 2015/11/07 | 02 | 2015/11/30 | 02 | 00 (අසමත්) | 29300.00 | 14650.00 |
| 16 | මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය *(දිස්ත්‍රික් මට්ටමින්)* | 147 | 146 | 2015/11-09-13 | 144 | 2015/12/10 | 131 | 13 | - | - |
| 17 | මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 31 | 30 | 2015/11/24 | 21 | 2015/12/29 | 07 | 14 | - | - |
| 18 | මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය *(දිස්ත්‍රික් මට්ටමින්)* | 155 | 155 | 2015/11/16-20 | 151 | 2015/12/15 | 130 | 21 | - | - |
| 19 | ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා (PL02-2006A)මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය | 505 | 100 | 2015/04/08 | 100 | 2015/04/09 | 100 | 00 (අසමත්) | 15227.00 | 152.00 |
| 20 | ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා (PL02-2006A)මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය - අගෝස්තු | 1175 | 439 | 2015/08/26 | 438 | 2015/0904 | 438 | 00 (අසමත්) | 61202.50 | 140.00 |
| 21 | ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා (PL02-2006A)මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය - දෙසැම්බර් | 1800 | 61 | 2015/12/08 | 61 | 2015/12/10 | 61 | 00 (අසමත්) | 6570.00 | 108.00 |

## 10.0 පර්යේෂණ හා සංවර්ධන අංශය

දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය කෙරෙහි බලපාන දුර්වල ක්ෂේත්‍රයන් හඳුනා ගෙන ඒවා යථාවත් කර ගැනීම සඳහා අදාල යෝජනා ඉදිරිපත් කිරීම, දෙපාර්තමේන්තුවේ මැනුම් හා සිතියම්කරණය සඳහා අවශ්‍ය වන නව ක්‍රමවේදයන් හඳුනා ගැනීම සහ ඒවා දෙපාර්තමේන්තුවේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩිකිරීම සඳහා හඳුන්වාදීම, නව තාක්ෂණික ක්‍රමවේදයන් පර්යේෂණ තුලින් හඳුන්වාදීම, නව තාක්ෂණය හැසිරවීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම, දෙපාර්තමේන්තු සිතියම් පිඹුරු යනාදියේ තත්ව පිරිවිතරයන් ආරක්ෂා කිරීම යනාදිය මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි.

මේ මගින් සංඛ්‍යාංක තාක්‍ෂණය දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයට ආදේශ කිරීමේ පරිවර්තිත ක්‍රියාවලිය හොඳින් ඉටු කිරීමට බලාපොරොත්තු වේ. දෙපාර්තමේන්තු රෙගුලාසි/ නිත්‍ය නියෝග සුදුසු පරිදි සංශෝධනය හා මැනුම් සඟරාව පල කිරීමද මෙම අංශයෙන් ඉටුවන තවත් කාර්ය භාරයකි.

ඉහත සඳහන් අවශ්‍යතාවයන් පරිපූර්ණත්වයට පත්කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාදාමයන් ව්‍යාපෘති මෙම අංශය මගින් 2015 වර්ෂයේ දී සිදුකර ඇත.

I. විවෘත ප්‍රභව මෘදුකාංගයක් වන Open Street Map භාවිත කර භූලක්ෂණාත්මක පිඹුරු යථාවත් කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදීම සහ එය 2015 වර්ෂයේ පැවැත් වූ අධීක්ෂණ නිලධාරීන්ගේ සමුළුවේදී ඉදිරිපත් කිරීම.

II. රජයේ මිනින්දෝරුවන්ට සහ බලයලත් මිනින්දෝරුවන්ට SDCAD මෘදුකාංගය භාවිතය සඳහා කටයුතු සැලසීම.

III. ACRS 2016 ජාත්‍යන්තර සමුළුව සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීම.

IV. ගබඩා කළමණාකරණය සඳහා අන්තර්ජාලගත ගබඩා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම.

V. නවක මිනින්දෝරුවරුන් සඳහා වෘත්තීය නිපුණතා වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

VI. 2016 දී පැවැත්වීමට නියමිත දුරස්ථ ග්‍රහණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට අදාල කැබිනට් පත්‍රිකා සකස් කිරීම සහ වැදගත් කර්තව්‍යයන් සංවිධානය කිරීම.

VII. දෙපාර්තමේන්තු රාජකාරී කටයුතුවල කාර්යක්ෂමතාවය දියුණු කිරීම සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග හා දෘඩාංග සහ ස්වයංක්‍රීය උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය වන පිරිවිතර සකස් කිරීම.

VIII. දෙපාර්තමේන්තු සිංහල මැනුම් රෙගුලාසි ඉංග්‍රීසි හා දෙමළ භාෂාවන් සඳහා 100% ක් පරිවර්තන කටයුතු නිමා කිරීම.

## 11.0 හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් අංශය

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව දිවයිනේ පිහිටි රජයේ සහ පෞද්ගලික ඉඩම් සඳහා හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීමේ අරමුණින් ඉඩම් අමාත්‍යාංශය මගින් 2007 වර්ෂයේ ආරම්භව ක්‍රියාත්මක වන බිම්සවිය වැඩසටහන යටතේ අවශ්‍ය වන කැඩැස්තර සිතියම් හා කැඩැස්තර පිඹුරු දෙපාර්තමේන්තුව මගින් සකස් කිරීම කරනු ලබයි. එම කටයුතු දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මගින්ද, එහි සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සර්වේයර් ජනරාල් කාර්යාලයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් අංශය මගින්ද සිදු කරනු ලබයි.

2015 වසරේදී බිම්සවිය වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 54 ක පමණ කටයුතු කිරීමට ඉඩම් අමාත්‍යාංශය විසින් මූලික කටයුතු සිදු කර තිබුණද මෙම වසර තුලදී ඉන් කොට්ඨාශ 52 ක මැනුම් වැඩ කටයුතු කරගෙන යාමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණු අතර, ඊට අමතරව තවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 37 ක බෙදාදීමට නියමිත රජයේ ඉඩම්, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ

ලියාපදිංචි කිරීමට හැකිවන පරිදි ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ ඉල්ලීම මත මැනුම් කටයුතු කිරීමටද මෙම වසරේ කටයුතු කරන ලදී.

බිම්සවිය වැඩසටහන යටතේ අපේක්ෂිත ප්‍රතිපාදන නොලැබුනු නිසා බලාපොරොත්තු වූ ආකාරයට පෞද්ගලික මිනින්දෝරුවරුන් මඟින් මැනුම් කිරීම සීමා වුනු අතර, ඒ අනුව මෙම වර්ෂය තුල දායක වූ රජයේ මිනින්දෝරු වරුන් මගින් ඉඩම් කැබලි 90,777 ක්ද ලියාපදිංචි බලයලත් මිනින්දෝරු වරුන් මගින් ඉඩම් කැබලි 15,398 කද මැනුම් කටයුතු සිදු කර මුළු කැබලි ප්‍රමාණය106,175 ක කැඩැස්තර සිතියම් සකස් කර ඇත.

ඒ අනුව කටයුතු කිරීම සඳහා බිම්සවිය වැඩසටහන යටතේ 2015 වසර සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 252.2 ක වියදමක් මෙම දෙපාර්තමේන්තුව මගින් වැය කර ඇත.

බිම්සවිය වැඩ සටහනට සමගාමීව මූලික ඉඩම් තොරතුරු රැස් කිරීම වේගවත් කිරීම සඳහා දළ සිතියම් සකස් කිරීමේ නියමු වැඩසටහනක් පහල කොස්ගම ග්‍රාම නිලධාරි වසමේ සිදු කරන ලද අතර එහි ප්‍රතිඵල සමාලෝචනය කොට දිවයින පුරා එම වැඩ සටහන 2016 වසර තුල ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

බිම්සවිය වැඩසටහනේ වර්තමාන ප්‍රගතිය දැක්වෙන සිතියම් කිහිපයක් 08 වෙනි ඇමුණුමේ දක්වා ඇත.

## 12.0 විගණන කටයුතු

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු විගණනය කිරීම සඳහා අංශයක් මෙම දෙපාර්තමේන්තුව තුල ස්ථාපනය කර ඇති අතර ඊට අමතරව අභ්‍යන්තර විගණන අංශය මගින්ද විගණන පරීක්ෂණ පවත්වනු ලැබේ.

### අභ්‍යන්තර විගණන අංශය

සර්වේයර් ජනරාල් ගේ සෘජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වේ. ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල් (කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව) ගේ මග පෙන්වීම අනුව සර්වේයර් ජනරාල් සහ විගණකාධිපති ගේ එකඟතාවය මත 2015 වසර සඳහා සැලසුම් කළ විගණන වැඩ සටහන පදනම් කරගෙන සියළුම විගණනයන් සිදු කරන ලදී.

මෙහිදී භාණ්ඩාගාර චක්‍රලේඛ අංක IA/2001/1, කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක **DMA/2009(1)** සහ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 243/2015 කෙරෙහි විශේෂ අවධානය යොමු කල අතර, ඒ තුලින් ආයතනයේ ඵලදායිතාවය හා කාර්යසාධනය ප්‍රශස්ත මට්ටමකට ළඟා කර ගැනීම සඳහා සිරිත් පරිදි කෙරෙන මූල්‍ය විගණනයන්ට වඩා පද්ධති විශ්ලේෂණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

ඒ අනුව 2015 වසරේ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල 16ක් ද, පළාත් මැනුම්පති කාර්යාල 8ක්ද, ප්‍රධාන කාර්යාලයේ අංශ 04ක්ද විශේෂ පරීක්ෂණ (පෙත්සම්) 03ක්ද සාර්ථක ලෙස නිම කරන ලදී. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ මග පෙන්වීම යටතේ මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන සාක්ෂි පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශවල සමස්ථ ඉදිරිපත් කිරීම පිලිබඳ ඇගයීම සහ යොදා ගන්නා ගණකාධිකරණ ප්‍රතිපත්ති නිවැරදිද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයන් වලට ඇතුලත් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්තමේන්තුවේ දැඩි මූල්‍ය විනයක් සහ ආයතන කළමණාකාරිත්වයේ වර්ධනයක් නිරීක්ෂණය වී ඇත.

## 13.0 ප්‍රගති අංශය

ප්‍රධාන වශයෙන් පහත සඳහන් කාර්යයන් මෙම අංශයෙන් ඉටු කරනු ලබයි.

### 13.1 කාර්ය සාධන වාර්තාව

2014 වර්ෂයේ සර්වේයර් ජනරාල්ගේ කාර්ය සාධන වාර්තාව සකස් කර නියමිත පරිදි බෙදා හැර ඇත.

### 13.2 දෛනික තැපෑල බෙදා හැරීම

දෛනික තැපැල බෙදා හැරීම වර්ෂය පුරා නිතිපතා මැනවින් සිදු කරන ලද අතර, එමඟින් පරිපාලන කටයුතු මැනවින් ක්‍රියාත්මක වීම පහසු කරනු ලැබීය.

### 13.3 චක්‍රලේඛ බෙදා හැරීම

එක් එක් අංශවලට අදාලව සර්වේයර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන පහත සඳහන් චක්‍රලේඛ මුද්‍රණය කර දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය අතර බෙදා හරින අතර, දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථානගත ක්ෂේත්‍ර නිලධාරීන් වෙතද මෙම අංශය මගින් චක්‍රලේඛ තැපැල් කර යවනු ලැබේ.

### 13.4 භාෂා පරිවර්තනය

ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශයන්හි භාෂා පරිවර්තන අවශ්‍යතාවයන් ඉටුකරනු ලබන අතර සිංහල - ඉංග්‍රීසි පරිවර්තන කාර්යය භාෂා පරිවර්තක නිලධාරිනිය මගින් සිදු කරනු ලැබේ. දෙමළ භාෂා පරිවර්තක නිලධාරි තනතුරෙහි නිලධාරියෙකු නොවීම හේතුවෙන් දෙමළ භාෂා පරිවර්තන කටයුතු මුදල් ගෙවා බාහිර පරිවර්තකයෙකු මගින් ඉටු කරවා ගැනීමට සිදුව ඇත.

කෙසේ වෙතත් චක්‍රලේඛ ඇතුළු අදාල ලිපි ලේඛන භාෂාත්‍රයෙන්ම යැවීමට අවශ්‍ය කටයුතු මෙහිදී ඉටු කෙරේ.

| චක්‍රලේඛ වර්ගය | චක්‍රලේඛ සංඛ්‍යාව |
|---|---|
| අධිකාරී චක්‍රලේඛ | 0 |
| අධිකාරී චක්‍රලේඛ ලිපි | 03 |
| පරිපාලන චක්‍රලේඛ | 03 |
| පරිපාලන චක්‍රලේඛ ලිපි | 04 |
| ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ | 12 |
| ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ ලිපි | 16 |
| කාර්ය මණ්ඩල චක්‍රලේඛ | 04 |
| කාර්ය මණ්ඩල චක්‍රලේඛ ලිපි | 40 |

## 13.5 අධ්‍යයන සැසි

මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයසහ විවිධ අංශ **අධ්‍යයනය** කිරීම සඳහා පැමිණෙන විශ්ව විද්‍යාල සිසුන් හා ආරක්ෂක හමුදා නිලධාරීන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙනු ලබන්නේ ප්‍රගති අංශයෙන් වන අතර, සමාලෝචිත වර්ෂයේ දී විශ්ව විද්‍යාල සිසුන් හා ආරක්ෂක හමුදා නිලධාරී කණ්ඩායම් 14ක් සඳහා අධ්‍යයන සැසි පවත්වා ඇත.

## 13.6 අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් අනුමැතිය

දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් සඳහා ලැබෙන ඉල්ලීම් සර්වේයර් ජනරාල් වෙතින් හා අමාත්‍යාංශ ලේකම් වෙතින් අනුමත කර ගැනීමේ කටයුතු සහ ඒ ඒ නිලධාරීන් වෙත අදාල පරිදි අනුමැතිය ලබා දීම ප්‍රගති අංශයේ තවත් කාර්යයකි. මේ අනුව **2015** වසරේදී මෙවැනි අනුමත කිරීම් **1324** ක් සිදුකර ඇත.

# 14.0 වෙනත් තොරතුරු

## 14.1 ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු

සමාලෝචනයට භාජනය වූ වසර පුරාම මෙම සේවාවන් දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ පුද්ගලික අංශයෙන් ඉටු කර ඇත. කොමර්ෂල් ෂීල්ඩ් ඇලේබල් සිකියුරිටි සර්විසස් (පුද්ගලික) සමාගම ආරක්ෂක කටයුතු සිදු කල අතර, නිපුනි ක්ලීනින් සර්විස් (පුද්ගලික) සමාගම දෙපාර්තමේන්තුවේ පිරිසිදු කිරීම් හා කාර්යාල පරිශ්‍රය පවිත්‍රව හා දර්ශණීය ලෙස පවත්වා ගැනීම මැනවින් සිදු කරන ලදී. ඔවුන්ගෙන් සිදු වූ සේවාවන් මෙහිලා අගය කරමි.

## 14.2 සේවක සුභසාධනය

දෙපාර්තමේන්තුවේ සුභසාධනය සඳහා පත්කළ සුභසාධක නිලධාරි විසින් සුභසාධනය කටයුතුඉටුකරනු ලබන අතර,සමාලෝචිත වසර තුලදී සාමාන්‍ය සුභසාධන කටයුතුවලට අමතරව පහත සඳහන් විශේෂ කාර්යයන්ද ඉටුකර ඇත.

i. ජනවාරි මස 01 වන දින රාජකාරි ආරම්භ කිරීමට පෙර සෙත් පිරිත් දේශනයක් පවත්වා සියළුම කාර්ය මණ්ඩලයට තේ පැන් සංග්‍රහයක් පැවැත්වීම.
ii. සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය පැවැත්වීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ඔවුන්ගේ දරුවන් සහභාගි කරවා ගැනීම හා ජයග්‍රාහකයින්ට තෑගි පිරිනැමීම.
iii. සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් හා වර්ෂාවසානයේදී කාර්ය මණ්ඩලයට විදුලි උපකරණ, පාවහන්, රෙදිපිළි හා පොත්පත් යනාදිය සහන මිලට ණය පදනම මත ලබාදීම.
iv. කාර්ය මණ්ඩලයේ කුඩා දරුවන් රැක බලා ගැනීම සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කර පවත්වා ගෙන යාම.
v. සහන මිලට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේ වෙළඳ සැලක් දිවා විවේකයේ දී පවත්වා ගෙන යාම හා සුභසාධක ආපනශාලාවේ කටයුතු මැනවින් පවත්වා ගෙනයාම.
vi. වෙසක් උත්සවය, නවරාත්‍රි උත්සවය පැවැත්වීමෙන් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ මානසික සංවේදනය නැංවීම.

vii. සේවක සුහසිද්ධිය සඳහා විවිධ වෛද්‍යසායන හා උපදෙස් වැඩ සටහන් පැවැත්වීම.

viii. විවිධ අංශවල පවත්වා ගෙන යනු ලබන ප්‍රථමාධාර පෙට්ටි මනාව නඩත්තු කිරීම.

මෙයට අමතරව කාර්ය මණ්ඩලයේම සංවිධානයෙන් යුත් සමූපකාර ණය දීමේ සමිතියක්ද, ක්‍රීඩා සමාජයක්, පුස්තකාලයක් හා කියවීමේ ශාලාවක්ද ක්‍රියාත්මකව පවතී. තවද බෞද්ධ සංගමය හා සංගීත කවය මගින් පොදු කටයුතු ක්‍රියාකාරකම්ද සිදු කරනු ලැබේ.

## 15.0 සමාප්තිය

සමාලෝචිත වසර සඳහා සැලසුම් කල පරිදි ඉලක්කගත කාර්යයන් සපුරාලීමට අමතරව රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා මෙන්ම සමාජ සුභසාධන කටයුතු සඳහා අවශ්‍ය වන්නාවූ හදිසි මැනුම් හා සිතියම් අවශ්‍යතාවයන් ඉතා සාර්ථකව ඉටු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි වූ අතර, මැනුම් කටයුතුවල ප්‍රගතිය 103% දක්වා ළඟාකර ගැනීමටද හැකි විය. එවන් කාර්ය සාධනයක් මෙම වර්ෂය තුළදී ඉටු කර ගැනීමට සහාය වූ දෙපාර්තමේන්තුවේ සියළුම සේවාවලට හා සියළුම මට්ටම්වලට අයත් සේවක මණ්ඩල සාමාජිකයින්ගේ සේවය ඉහලින්ම අගය කරන බව මෙහිලා සනිටුහන් කළ යුතුය. එමෙන්ම මෙම කාර්යයන් ඉටු කිරීමේ දී ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් මෙන්ම සියළුම වෘත්තීය සමිතිවලින්ද ලද සහයෝගය අගය කරමි.

**පී.එම්.පී. උදයකාන්ත**
**සර්වේයර් ජනරාල්**

*ඇමුණුම 01*

## කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | අනුමත තනතුරු නම | තනතුරු සංඛ්‍යාව | පෙර වසරේ සිටි සංඛ්‍යාව | විශ්‍රාම යෑම් | ස්ථාන මාරු | | බ දවා ගැනීම් | උසස්වීම් | ප්‍රවර්ථන වසරේ සිටි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ගිය | පැමිණි | | | |
| 1. | සර්වේයර් ජනරාල් | 01 | 01 | | | | | | 1 |
| 2. | අතිරේක සර්වේයර් ජනරාල් | 03 | 03 | | | | | | 03 |
| 3. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් | 05 | 05 | | | | | | 05 |
| 4. | නියෝජ්‍ය සර්වේයර් ජනරාල්/පළාත්සර්වේයර් ජනරාල් | 15 | 15 | 02 | | | | 02 | 15 |
| 5. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී | 60 | 60 | 02 | | | | 02 | 60 |
| 6. | මිනින්දෝරු අධිකාරී | 139 | 17 | 02 | | | | 05 | 20 |
| 7. | සහකාර මිනින්දෝරු අධිකාරී/මිනින්දෝරුවරුන්/ ආධුනික මිනින්දෝරුවරුන් | 850 | 819 | 12 | | | | | 802 |
| 8. | ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරී | 01 | 01 | | | | | | 01 |
| 9. | සිතියම් නිෂ්පාදන නිලධාරී | 01 | 01 | | | | | | 01 |
| 10. | කාර්මික හා පරිපාලන නිලධාරී | 44 | 29 | 01 | | | | | 28 |
| 11. | ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරී - විශේෂ පංතිය | 56 | 39 | 01 | | | | 02 | 40 |
| 12. | සිතියම් තාක්ෂණ නිලධාරී I,II,III හා පුහුණු ශ්‍රේණිය | 574 | 427 | 06 | 20 | | | 02 | 399 |
| 13. | නැවිගේටර් | 01 | 01 | | | | | | 01 |
| 14. | ඡායාරේඛණමිතිඥ | 01 | - | | | | | | - |
| 15. | ඡායාරේඛණමිතික තාක්ෂණ නිලධාරී -විශේෂ පංතිය | 04 | 02 | | | | | | 02 |
| 16. | ඡායාරේඛණමිතික තාක්ෂණ නිලධාරී -I,II,III හා පුහුණු ශ්‍රේණිය | 26 | 25 | | | | | | 25 |
| 17. | දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරී - විශේෂ පංතිය | 01 | - | | | | | | - |
| 18. | දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරී - I,II,III හා පුහුණු ශ්‍රේණිය | 13 | 13 | | | | | | 13 |
| 19. | ගුවන් ඡායාරූප හා රසායනාගාර තාක්ෂණ නිලධාරී -විශේෂ පංතිය | 01 | 01 | | | | | | 01 |
| 20. | ගුවන් ඡායාරූප හා රසායනාගාර තාක්ෂණ නිලධාරී - I,II,III හා පුහුණු ශ්‍රේනිය | 06 | 05 | | | | | | 05 |
| 21. | ලිතෝ තාක්ෂණ නිලධාරී - විශේෂ පංතිය | 03 | 03 | | | | | | 03 |
| 22. | ලිතෝ තාක්ෂණ නිලධාරී -I,II,III හා පුහුණු ශ්‍රේණිය | 15 | 09 | | | | | | 09 |
| 23. | පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී - විශේෂ පංතිය | 01 | 01 | | | | | | 01 |
| 24. | පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී - I,II | 07 | 03 | | | | | | 03 |
| 25. | ප්‍රවාහන නිලධාරී | 01 | - | | | | | | - |
| 26. | තොරතුරු තාක්ෂණ සහකාර | - | 01 | | | | | | 01 |
| 27. | වැඩ සටහන් සම්පාදක 111 | 01 | - | | | | | | - |
| 28. | දත්ත ක්‍රියාකරු | - | 01 | | | | | | 01 |
| 29. | නීති නිලධාරී | 01 | - | | | | 01 | | 01 |
| 30. | නීති සහකාර | 02 | 02 | | 01 | | | 01 | - |
| 31. | ගොඩනැගිලි පරිපාලක | 01 | - | | | | | | - |

| අනු අංකය | අනුමත තනතුරු නම | තනතුරු සංඛ්‍යාව | පෙර වසරේ සිටි සංඛ්‍යාව | විශ්‍රාම යෑම් | ස්ථාන මාරු | | බ දවා ගැනීම් | උසස්වීම් | ප්‍රවර්ථන වසරේ සිටි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ගිය | පැමිණි | | | |
| **32.** | මැනුම් උපකරණ කාර්මික ශිල්පි - තේරීම් ශ්‍රේණිය | 02 | 02 | 01 | | | | | 01 |
| **33.** | මැනුම් උපකරණ කාර්මික ශිල්පි - I,II,III | 15 | 05 | 01 | | | 01 | | 05 |
| **34.** | වඩුකාර්මික I,II | 09 | 04 | | 01 | 01 | | | 03 |
| **35.** | පැස්සුම්කරු | 01 | 01 | | | | | | 01 |
| **36.** | මෙවලම් කම්කරු | 04 | 04 | | | | | | 04 |
| **37.** | රිය සහායක | 07 | 07 | 01 | | | | | 06 |
| **38.** | සිතියම් සවිකරන්නා හා පොත් බඳින්නා | 04 | 03 | | | | | | 03 |
| **39.** | පිඹුරු අළුත්වැඩියාකරන්නා | 07 | 04 | 02 | | | | | 02 |
| **40.** | වායුසමීකරණ යාන්ත්‍රික | 01 | 01 | | | | | | 01 |
| **41.** | පෙදරේරු | 01 | - | | | | | | - |
| **42.** | සංචාරක බංගලා භාරකරු | 05 | 05 | | | | | | 05 |
| **43.** | අඳුරු කාමර සහකාර | 04 | 03 | | | | | | 03 |
| **44.** | ඡායාපිටපත්යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 | | | | | | 01 |
| **45.** | දෙපාර්තමේන්තු කම්කරු | 170 | 166 | | | | | 05 | 161 |
| **46.** | මෝටර් කාර්මික | 02 | 01 | | | | | | 01 |
| **47.** | දත්ත සටහන්කරු | | 01 | | | | | | 01 |
| **48.** | අති.ස.ජ.(මානව සම්පත් හා පාලන) | 01 | 01 | | | | | | 01 |
| **49.** | ශ්‍රී ලංකා පරිපාලන සේවය 1 | 01 | 01 | | | | | | 01 |
| **50.** | ශ්‍රී ලංකා පරිපාලන සේවය 111/11 | 02 | 0 | | | 01 | | | 01 |
| **51.** | ශ්‍රී.ල.ග.සේ. I වන පංතිය | 01 | 01 | | | | | | 01 |
| **52.** | ශ්‍රී.ල.ග.සේ. 111/11 | 12 | 08 | | 01 | 02 | | | 09 |
| **53.** | අභ්‍යන්තර විගණක | 01 | 01 | | | | | | 01 |
| **54.** | භාෂා පරිවර්තක | 01 | 01 | | | | | | 01 |
| **55.** | භාෂා පරිවර්තක සහකාර | 01 | - | | | | | | - |
| **56.** | පරිපාලන නිලධාරී | 01 | 01 | 01 | | | | | - |
| **57.** | රා.ක.ස.සේ. I/11/111 | 488 | 407 | 07 | 34 | 60 | | | 426 |
| **58.** | සංවර්ධන නිලධාරී | 166 | 115 | | 07 | 04 | | | 112 |
| **59.** | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 01 | - | | | | | | - |
| **60.** | තොරතුරු හා හා සන්නිවේදන නිලධාරි | 08 | - | | | | | | - |
| **61.** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 16 | 16 | | 01 | 04 | | | 19 |
| **62.** | ඒකාබද්ධ රියදුරු සේවය I/11/111 | 276 | 275 | 07 | 11 | 14 | | | 271 |
| **63.** | කාර්යාල සේවක සේවය I/11/111 | 207 | 130 | 02 | 07 | 21 | | | 142 |
| **64.** | මැනුම් ක්ෂෙත්‍ර සහායක - විශේෂ | 4154 | 2908 | 52 | - | - | 532 | 688 | 3388 |
| **65.** | මැනුම් ක්ෂෙත්‍ර සහායක 1 ශ්‍රේණිය | | | | | | | | |
| **66** | මැනුම් ක්ෂෙත්‍ර සහායක II ශ්‍රේණිය | | | | | | | | |
| **67** | මැනුම් ක්ෂෙත්‍ර සහායක III ශ්‍රේණිය | | | | | | | | |

ඇමුණුම 2

## ආයතනික කටයුතු

| අනු අංකය | විස්තර | පෙර වසර - 2014 | | | ප්‍රවර්තන වසර - 2015 | | |
|---|---|---|---|---|---|---|---|
| | | ලැබූ සංඛ්‍යාව | අනුමත කල | ඉතිරි සංඛ්‍යාව | ලැබූ සංඛ්‍යාව | අනුමත කල | ඉතිරි සංඛ්‍යාව |
| 1 | සේවයට බඳවා ගැනීම් | 1445 | 1031 | 803 | 634 | 534 | 100 |
| 2 | විභාග පැවැත්වීම * | | | | | | |
| 3 | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | 13 | 13 | - | 09 | 09 | - |
| 4 | සේවය ස්ථිර කිරීම | 206 | 206 | - | 66 | 65 | 01 |
| 5 | උසස් කිරීම | 148 | 97 | 51 | 128 | 64 | 64 |
| 6 | වැටුප් වර්ධක ගෙවීම | 4132 | 4010 | 122 | 1692 | 965 | 727 |
| 7 | සේවය දීර්ඝ කිරීම | - | - | - | 05 | 05 | - |
| 8 | බඳවා ගැනීමේ පරිපාටි සැකසීම | 05 | 05 | - | 02 | 01 | 01 |
| 9 | සේවය හැරයාම් | 37 | 37 | - | 40 | 03 | 37 |
| 10 | වැඩ තහනම් කිරීම් | 01 | 01 | - | - | - | - |
| 11 | නැවත සේවය පිහිටුවීම් | 05 | 05 | - | 01 | 01 | - |
| 12 | විනය පරීක්ෂණ | 20 | 12 | 35 | 55 | 14 | 41 |
| 13 | විදේශ නිවාඩු අනුමත කිරීම | 44 | 43 | 01 | 62 | 62 | - |
| 14 | විදේශ ශිෂ්‍යත්ව# | | | | | | |
| 15 | අමාත්‍ය මණ්ඩල සංදේශ | 01 | 01 | 01 | 01 | 01 | - |
| 16 | ඇප ආරම්භ කිරීම් | 315 | 315 | - | - | - | - |
| 17 | ඇප නිදහස් කිරීම් | 04 | 04 | - | 02 | 02 | - |
| 18 | ණය අනුමත කිරීම් දේපළ | 23 | 23 | - | 16 | 10 | 01 |
| | වාහන | | | - | 16 | 16 | - |
| | වෙනත් | 461 | 204 | 257 | - | - | - |

* විභාග පැවැත්වීම් සඳහා කරුණාකර 9.0 ජේදය බලන්න

# විදේශ ශිෂ්‍යත්ව සඳහා කරුණාකර ඇමුණුම 03 බලන්න.

*ඇමුණුම - 03*

## මානව සම්පත් සංවර්ධනය

## විදේශීය පුහුණු හා වැඩමුළු

**FOREIGN SCHOLARSHIPS / WORKSHOPS / TRAININGS / FORUMS - 2015**

| # | ශිෂ්‍යත්වය/පුහුණුවීම්/වැඩමුළුව | නම | තනතුර | රට | කාලසීමාව | |
|---|---|---|---|---|---|---|
| 1 | මිනුම් සහ සිතියම් නිෂ්පාදන ආයතනය සඳහා ශක්‍යතා වර්ධනය | නලින් ගුණවර්ධන මයා | ජො.මි.අ. | කොරියාව | 19/04/2015 | 09/05/2015 |
| 2 | මැනුම් කාර්යක්ෂමතාව සඳහා පාලන ලක්ෂ්‍ය කළමණාකරණය සහ භාවිතය | ටී.ඩී.වීරප්පෙරුම මයා | ජො.මි.අ. | ජපානය | 24/05/2015 | 01/07/2015 |
| 3 | උසස් නිලධාරීන් සඳහා කොරියා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ 2015 අත්දැකීම් හුවමාරුව | එන්.ජේ.විජේනායක මයා | ජො.මි.අ. | කොරියාව | 07/06/2015 | 13/06/2015 |
| 4 | KARI අන්තර්ජාතික අවකාශ පුහුණු වැඩසටහන 2015 | ජී.ඩී.එස්.එල්.කුලතුංග මයා | ජො.මි.අ. | කොරියාව | 27/06/2015 | 12/07/2015 |
| 5 | International Seminar on GlobeLand30 and its Applications | ඒ.විජේවර්ධන මයා | ජො.මි.අ. | චීනය | 29/06/2015 | 02/07/2015 |
| 6 | කළමණාකරණය සහ පරිපාලනය පිළිබඳ අන්තර්ජාතික වැඩසටහන | ජී.එන්.පී.සෙනෙවිරත්න | ජො.මි.අ. | බැංකොක් | 06/07/2015 | 12/07/2015 |
| 7 | UNGGIM සහ භූ අවකාශීය නියෝජ්‍යායතන 5 වන සැසිය | එස්.එම්.පී.පී.සංගක්කාර මයා | අති.ස.ජ.(මධ්‍යම) | නිව්යෝර්ක් | 03/08/2015 | 12/08/2015 |
| 8 | භූ රසායන සිතියම්කරණ සහ මැනුම් තාක්ෂණය | එස්.එන්.සතරසිංහ මිය | සි.තා.නි. | චීනය | 11/08/2015 | 31/08/2015 |
| 9 | E- Governance for Effective Land Administration Services Course | ආර්.රූබසිංහ මිය | ජො.මි.අ. | මොංගෝලියාව | 17/08/2015 | 28/08/2015 |
| 10 | ජාතික සිතියම්කරණය හා මැනීම සැලසුම්කිරීම හා කළමනාකරණය (G.T.C./R.T.C. Planning and Management of National Mapping Surveying ) | එම්.ඒ.එම්.සෝමලතා මිය | ජො.මි.අ. | ජපානය | 16/08/2015 | 19/12/2015 |
| 11 | *Smart Geospatial Expo 2014, 3rd Geospatial High-Level Forum* | පී.එම්.පී. උදයකාන්ත මයා | ස.ජ. | කොරියාව | 14/09/2015 | 18/09/2015 |
| 12 | *Smart Geospatial Expo 2014, 3rd Geospatial High-Level Forum* | කේ.ඒ.යූ.එන්. කස්තුරි මයා | අති.ස.ජ.(ක්ෂේත්‍ර) | කොරියාව | 14/09/2015 | 18/09/2015 |
| 13 | *Smart Geospatial Expo 2014, 3rd Geospatial High-Level Forum* | පී.ඒ.එන්.ද සිල්වා මයා | ජො.නි.ස.ජ. | කොරියාව | 14/09/2015 | 18/09/2015 |
| 14 | *Smart Geospatial Expo 2014, 3rd Geospatial High-Level Forum* | ජී.ජී.ධර්මප්‍රිය | ජො.මි.අ. | කොරියාව | 14/09/2015 | 18/09/2015 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15 | *CX-103 පූර්ණමාන (ඒකක 18) පිළිබඳ දෘඩාංග සේවා විදේශ පුහුණුව* | ඩබ්.නන්දසේන මයා | උපකරණ තාක්ෂණික ශිල්පී | සිංගප්පූරුව | 20/09/2015 | 24/09/2015 |
| 16 | *CX-103 පූර්ණමාන (ඒකක 18) පිළිබඳ දෘඩාංග සේවා විදේශ පුහුණුව* | කේ.එම්.සී.කේ.විජේරත්න මයා | උපකරණ තාක්ෂණික ශිල්පී | සිංගප්පූරුව | 20/09/2015 | 24/09/2015 |
| 17 | *CX-103 පූර්ණමාන (ඒකක 18) පිළිබඳ දෘඩාංග සේවා විදේශ පුහුණුව* | ඩී.අබේසේකර මයා | උපකරණ තාක්ෂණික ශිල්පී | සිංගප්පූරුව | 20/09/2015 | 24/09/2015 |
| 18 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඉඩම් පරිහරණ සැලසුම් පිළිබඳ සම්මන්ත්‍රණය 2015 | ඩබ්.ආර්.එම්.එල්.ඒ.වීරකෝන් මයා | ජ්‍යෙ.මි.අ. | චීනය | 14/10/2015 | 03/11/2015 |
| 19 | *ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඕස්ට්‍රේලියානු පරිපාලන ප්‍රවීණතාව අධ්‍යයනය* | එස්.එම්.පී.පී.සංගක්කාර මයා | අති.ස.ජ.(මධ්‍යම) | ඕස්ට්‍රේලියාව | 19/10/2015 | 13/11/2015 |
| 20 | *ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඕස්ට්‍රේලියානු පරිපාලන ප්‍රවීණතාව අධ්‍යයනය* | ඩී.එන්.ඩී.හෙට්ටිආරච්චි මයා | නි.ස.ජ. | ඕස්ට්‍රේලියාව | 19/10/2015 | 13/11/2015 |
| 21 | *ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඕස්ට්‍රේලියානු පරිපාලන ප්‍රවීණතාව අධ්‍යයනය* | කේ.ඒ.බී.එස්.රූපසිංහ මයා | මි.අ. | ඕස්ට්‍රේලියාව | 19/10/2015 | 13/11/2015 |
| 22 | ACRS 2015 | පී.එම්.පී. උදයකාන්ත මයා | ස.ජ. | පිලිපීනය | 19/10/2015 | 23/10/2015 |
| 23 | ACRS 2015 | එස්.ඩී.පී.දාම්පේගම මයා | ජ්‍යෙ.නි.ස.ජ. | පිලිපීනය | 19/10/2015 | 23/10/2015 |
| 24 | AIT mini project under the Sentinel initiative of Jaxa | ආර්.එස්.එස්.රංගලි මිය | රජයේ මිනින්දෝරු | තායිලන්තය | 15/11/2015 | 12/12/2015 |
| 25 | Geo Information Extraction With Lazer Scaning Programme | එම්.එම්.එන්.කේ.බණ්ඩාර මයා | ඡායා රේඛාණමිතික ශිල්පී | තායිලන්තය | 02/11/2015 | 06/11/2015 |
| 26 | ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය සඳහා ශක්‍යතා වර්ධන වැඩසටහන | ඩබ්.ඒ.ඩී.විජයරත්න මිය | අධ්‍යක්ෂ(මුදල්) | එ.රා. | 03/11/2015 | 13/11/2015 |
| 27 | ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය සඳහා ශක්‍යතා වර්ධන වැඩසටහන | ආර්.එම්.ඊ.ජී.කුමාරි මිය | අභ්‍යන්තර විගණක | එ.රා. | 03/11/2015 | 13/11/2015 |
| 28 | International Seminar on Geodetic Reference Frame & Locations | ඒ.දිසානායක මයා | නි.ස.ජ. | චීනය | 24/11/2015 | 27/11/2015 |
| 29 | Asia Pacific User Conference 2015 | එස්.ශිවනන්දරාජා | ජ්‍යෙ.මි.අ. | තායිලන්තය | 30/11/2015 | 1/12/2015 |

## දේශීය පුහුණුව කෙටිකාලීන - 2015

| පාඨමාලාව | ආයතනය | තනතුර | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| කැබිනට් පත්‍රිකා ලිවීම | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ජ්‍යෙ.මි.අ. | 01 |
| රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය ඉඩම් කළමණාකරණය පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | නීති නිලධාරී | 01 |
| ධනාත්මක චින්තනය හා වැඩ ආචාර ධර්ම පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ජ්‍යෝ.මි.අ. | 01 |
| ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීම | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ජ්‍යෝ.මි.අ. | 01 |
| ඉඩම් කළමණාකරණය පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | **01** |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික නීති පිළිබඳ පුහුණුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | **01** |
| රාජ්‍ය මුදල් කළමණාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | **09** |
| වැටුප් පරිවර්තන පිළිබඳ පුහුණු වැඩසටහන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | **02** |
| රජයේ නිලධාරීන් දැනුවත් විය යුතු නීති පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | **02** |
| කාර්යාල සේවක සේවයේ කාර්යාභිවර්ධන පුහුණුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | කා.සේ.සේ | **02** |
| ඊ-රාජ්‍ය භාවිතය සහ සුරැකුම | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | **01** |
| මානව සම්පත් කළමණාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| ඵලදායිතාවය සහ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම පිණිස ධනාත්මක ආකල්පය වර්ධනය කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| රාජකාරී ලිපි ලිවීමේ කෞශල්‍යය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| පාරිභෝගික සත්කාරය සහ මහජන සත්කාරය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| රජයේ විගණන කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| විශ්‍රාම වැටුප් කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | **04** |
| පුද්ගල සහ පෞරුෂත්වය පිළිබඳ පුහුණු වැඩසටහන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| ස්වයං සංවර්ධනය සහ භාවාත්මක ඥානය තුළින් කාර්ය දිවිය තුලනය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | මි.අ | 02 |
| දින 12 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | සි.තා.නි | 03 |
| රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ පුහුණුව | SDFL | රා.ක.ස රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| ආයතනික යහපාලනය සහ සේවා ස්ථානයේ ගැටුම් නිරාකරණය | Sri Lanka Foundaton | අති.ස.ජ./ ප්‍ර.කා.ප.නි. / නි.ස.ජ. / ජ්‍යෝ.මි.අ. | 06 |
| ගබඩා කළමණාකරණය සහ මිලදී ගැනීම් ක්‍රියාවලිය | SDFL | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| සරප්/මුදල් අයකැමි තනතුරේ කාර්යභාරය හා වගකීම | SDFL | රාජ්‍ය කළමනාකරණ සහකාර | **01** |

| | | | |
|---|---|---|---|
| ධනාත්මක චින්තනය සහ වැඩපල ආචාර ධර්ම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ජ්‍යෙ.මි.අ. /ප.ස.ජ./කාර්මික හා පරිපාලන නිලධාරී | **04** |
| ධනාත්මක ආකල්ප වර්ධනය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | All minior Staff in Dept | **80** |
| සුබෝධා උපදේශන මනෝවිද්‍යාත්මක සංවාද මණ්ඩපය | සමාජ සේවා සුභසාධන හා පශු සම්පත් අමාත්‍යා. | Staff Grade Officers in Dept | **30** |
| ඔබේ ආකල්ප වෙනස් කිරීම මගින් ඔබේ බුද්ධියෙහි සීමාව පුළුල් කිරීම | Skills Development fund Ltd | Navigator / කාර්මික හා පරිපාලන නිලධාරී | **02** |
| අභ්‍යන්තර පාලනය සහ විගණනය | The Institute of Charted Accountants | ප්‍රධාන අභ්‍යන්තර විගණක | **01** |
| ජාතික තොරතුරු තාක්ෂණික සම්මන්ත්‍රණය | The Computer Society of Sri Lanka | නි.ස.ජ. | **01** |
| Esri Arc GIS Desktop Training | GIS Solution pvt ltd | සි.තා.නි. | **06** |
| රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය | Dept. of National Archives | ජ්‍යෙ.නි.ස.ජ. | **01** |
| Arc GIS User Conference on Building Smart Communities | GIS Solution pvt ltd | සි.තා.නි | **07** |
| අයවැය යෝජනා 2016 බදු පිළිබඳ වැඩමුළුව | SDFL | **Chief Financial offices / Accountants** | **01** |

## දේශීය පුහුණුව දිගු කාලීන-2015

| පාඨමාලාව | නම | තනතුර | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|---|
| දෙමළ භාෂා පාඨමාලාව | සියළුම කාණ්ඩ වලට අයත් නිලධාරීන් | | | පැය 150 |
| පරිගණක දෘඩාංග කාර්මික ශිල්පී | ආර්.එම්.ඒ.එස්.ටී.පී.සී.සෙනෙවිරත්න | සි.තා.නි | ජාතික වෘත්තීය පුහුණු ආයතනය (පාඨමාලාව අවසන් නැත.) | මාස 06 |
| තොරතුරු පද්ධති සුරැකුම් පාලනය සහ විගණනය පිළිබඳ ඩිප්ලෝමාව | ඊ.ජී.කේ.ගොකරුල්ල | අභ්‍යන්තර විගණක | වරලත් ගණකාධිකාරී ආයතනය (පාඨමාලාව අවසන් නැත.) | වසර 01 |
| රාජ්‍ය කළමණාකාර සහකාර පිළිබඳ ඩිප්ලෝමාව | රා.ක.ස. නිලධාරීන් 12 | | | වසර 05 |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය | ආර්.රුබසිංහ | ජ්‍යෙ.මි.අ. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | මාස 06 |

ඇමුණුම - 4

# වැය ඇස්තමේන්තුව

| | පෙර වර්ෂය (2014) | | | වියදම් ප්‍රතිශතය | ප්‍රවර්තන වර්ෂය (2015) | | | වියදම් ප්‍රතිශත |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම් | ඉතිරිය | | ප්‍රතිපාදන | වියදම් | ඉතිරිය | |
| **වැඩ සටහන 1 ව්‍යාපෘති 1** | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 117,800,000 | 116,965,592 | 834,408 | 99% | 148,945,000 | 143,902,058 | 5,042,943 | 97% |
| වෙනත් පුනරාවර්තන | 67,110,750 | 65,712,297 | 1,398,453 | 98% | 76,890,940 | 71,450,399 | 5,440,541 | 93% |
| ප්‍රාග්ධන | | | | | | | | |
| **2001** | 18,000,000 | 17,994,475 | 5,525 | 100% | 19,000,000 | 16,495,291 | 2,504,709 | 87% |
| **2002** | 2,925,000 | 2,802,300 | 122,700 | 96% | 3,250,000 | 3,227,400 | 22,600 | 99% |
| **2003** | 1,975,000 | 1,895,938 | 79,062 | 96% | 2,400,000 | 2,331,044 | 68,956 | 97% |
| **2102** | 900,000 | 899,959 | 41 | 100% | 1,000,000 | 998,501 | 1,499 | 100% |
| **2103** | 2,400,000 | 2,190,054 | 209,946 | 91% | 2,500,000 | 2,487,211 | 12,789 | 99% |
| **2104** | 11,000,000 | 10,616,161 | 383,839 | 97% | 78,000,000 | 74,595,579 | 3,404,421 | 96% |
| **2401** | 330,000 | 327,554 | 2,446 | 99% | 350,000 | 342,943 | 7,057 | 98% |
| **වැඩ සටහන 2** | | | | | | | | |
| **ව්‍යාපෘතිය 2** | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 1,935,035,230 | 1,931,554,991 | 3,480,239 | 100% | 2,500,555,000 | 2,458,204,125 | 42,350,875 | 98% |
| වෙනත් පුනරාවර්තන | 152,023,000 | 149,219,674 | 2,803,326 | 98% | 184,025,501 | 178,116,751 | 5,908,750 | 97% |
| ප්‍රාග්ධන | | | | | | | | |
| **2001** | 11,000,000 | 10,970,677 | 29,323 | 100% | 20,000,000 | 19,868,896 | 131,104 | 99% |
| **2002** | 13,000,000 | 12,587,992 | 412,008 | 97% | 15,000,000 | 14,820,449 | 179,551 | 99% |
| **2003** | 15,000,000 | 14,627,499 | 372,501 | 98% | 15,000,000 | 14,904,154 | 95,846 | 99% |
| **2102** | 7,000,000 | 6,883,885 | 116,115 | 98% | 5,000,000 | 4,964,651 | 35,349 | 99% |
| **2103** | 50,000,000 | 27,018,898 | 22,981,102 | 54% | 65,000,000 | 64,561,329 | 438,671 | 99% |
| **2401** | 500,000 | 496,250 | 3,750 | 99% | 550,000 | 450,651 | 99,349 | 82% |
| **2502** | 10,000,000 | 9,495,253 | 504,747 | 95% | 10,000,000 | 6,972,669 | 3,027,331 | 70% |
| **වැඩ සටහන 2** | | | | | | | | |
| **ව්‍යාපෘතිය *3*** | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 84,354,730 | 84,317,191 | 37,539 | 100% | 106,189,000 | 105,924,582 | 364,418 | 100% |
| වෙනත් පුනරාවර්තන | 7,450,000 | 7,420,139 | 29,861 | 100% | 9,429,790 | 9,321,975 | 107,815 | 99% |
| ප්‍රාග්ධන | | | | | | | | |
| **2001** | 1,300,000 | 1,292,757 | 7,243 | 99% | 1,300,000 | 1,299,450 | 550 | 100% |
| **2002** | 600,000 | 600,000 | - | 100% | 600,000 | 580,030 | 19,970 | 97% |
| **2003** | 1,200,000 | 1,181,117 | 18,883 | 98% | 1,200,000 | 1,172,420 | 27,580 | 98% |
| **2102** | 250,000 | 248,213 | 1,787 | 99% | 300,000 | 300,000 | - | 100% |
| **2103** | 300,000 | 155,000 | 145,000 | 52% | 350,000 | 349,228 | 772 | 100% |
| **2401** | 220,000 | 220,000 | - | 100% | 500,000 | 491,680 | 8,320 | 98% |
| එකතුව | **2,511,673,710** | **2,477,693,866** | **33,979,844** | **99%** | **3,267,335,231** | **3,198,133,467** | **69,201,764** | **98%** |

*ඇමුණුම -05*

## රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ''බී'' ගිනුම

| සීමාවන් | පෙර වර්ෂය - 2014 | | ප්‍රවර්තන වර්ෂය - 2015 | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය |
| වියදමේ උපරිම සීමාව | 150,000,000 | 134,707,263 | 157,330,000 | 124,069,132 |
| අවම බැර සීමාව | 100,000,000 | 94,545,204 | 107,330,000 | 135,182,188 |
| උපරිම හර ශේෂ සීමාව | 400,000,000 | 328,619,155 | 380,000,000 | **317,506,099** |

| | 2014 වර්ෂය | 2015 වර්ෂය |
|---|---|---|
| මුදලින් හර | 119,784,352 | 110,969,211 |
| වෙනත් දෙපාර්තමේන්තු හර | 14,922,910 | 13,099,922 |
| | | |
| මුදලින් බැර | 86,374,277 | 123,265,174 |
| වෙනත් දෙපාර්තමේන්තු බැර | 8,170,927 | 11,917,015 |

***ඇමුණුම - 06***

**ආදායම් ගිණුම**

| | පෙර වර්ෂය - 2014 | ප්‍රවර්තන වර්ෂය - 2015 |
|---|---|---|
| ඇස්තමේන්තුව | 115,000,000 | 107,000,000 |
| වර්ෂයේ ආදායම | 156,469,407 | 308,202,479 |
| වෙනස (+/-) | 41,469,407 | 201,202,479 |

***ඇමුණුම 07***


## නිශ්චල දේපළ

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්වය | වර්ෂය තුල සිදුවූ වෙනස්වීම් | | | | වසර අවසානයේ පැවති තත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම් | මිළදී ගැනීම් | වෙන්දේසි කිරීම් | ඉවත් කිරීම් | |
| **1.** | ඉඩම් (හෙක්.) | 73.4181 | - | - | - | - | 73.4181 |
| **2.** | ගොඩනැගිලි | 182 | - | - | - | - | **186** |
| **3.** | ඉදි කිරීම් | **04** | - | - | - | - | **04** |


| අනු අංකය | වත්කම් වර්ගය | 2015වසර මුලදී පැවති තත්වය | වර්ෂය තුලදී සිදුවූ වෙනස්වීම් | | | | වසර අවසානයේ දී පැවති තත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම් | මිලදී ගැනීම් | වෙන්දේසි කිරීම් | ඉවත් කිරීම් | |
| 1 | මෝටර් ලොරි | 07 | - | - | - | - | 07 |
| 2 | මෝටර් ලොරි (සින්ගල් කැබ්) | 42 | - | - | - | - | 42 |
| 3 | මෝටර් කාර් | 06 | - | - | - | - | 05 |
| 4 | ජීප් | 57 | - | - | - | - | 57 |
| 5 | ඩබල් කැබ් | 157 | - | 10 | - | - | 167 |
| 6 | වෑන් | 29 | - | 06 | - | - | 35 |
| 7 | ත්‍රී රෝද රථ | 01 | - | - | - | - | 01 |
| 8 | ට්‍රැක්ටර් | 05 | - | - | - | - | 05 |
| 9 | බවුසර් | 04 | - | - | - | - | 04 |
| 10 | පාගන බයිසිකල් | 40 | - | - | - | - | 40 |
| 11 | ඩුප්ලිකේටර් යන්ත්‍ර | 28 | - | - | - | - | 28 |
| 12 | ඡායාපිටපත් යන්ත්‍ර | 143 | - | 24 | 01 | - | 166 |
| 13 | පරිගණක | 1005 | - | 78 | 83 | - | 1000 |
| 14 | පරිගණක ප්‍රින්ටර්ස් | 527 | - | 48 | 70 | - | 505 |
| 15 | ලැප් ටොප් පරිගණක | 109 | - | 08 | 09 | - | 108 |
| 16 | ෆැක්ස් යන්ත්‍ර | 129 | - | 09 | - | - | 138 |
| 17 | යතුරු ලියන (මැනුවල්) | 124 | - | - | 14 | - | 110 |
| 18 | සේප්පු | 25 | - | - | - | - | 25 |
| 19 | කැමරා (ප්‍රොසෙස් හා ඒරියල්) | 01 | - | - | - | - | 01 |
| 20 | ලිතෝ මුද්‍රණ යන්ත්‍ර | 05 | - | - | - | - | 05 |
| 21 | රූපවාහිනී යන්ත්‍ර | 09 | - | 03 | - | | 12 |
| 22 | ශීතකරණ | 12 | - | 01 | - | - | 13 |
| 23 | ගිලටින් යන්ත්‍ර | 03 | - | - | - | - | 03 |
| 24 | ඡායාරේඛණමිතික නියැකීම් යන්ත්‍ර | 10 | - | - | - | - | 10 |
| 25 | ටෝටල් ස්ටේෂන් මැනුම් උපකරණ | 400 | - | 27 | - | - | 427 |
| 26 | තියොඩලයිට් මැනුම් උපකරණ | 1004 | - | - | - | - | 1004 |
| 27 | ක්‍රමලේඛිත ගණක යන්ත්‍ර | 592 | - | - | - | - | 592 |
| 28 | විශාල වර්ගයේ ස්කෑන් යන්ත්‍ර | 04 | - | - | 01 | - | 03 |
| 29 | ඡායාරේඛණමිතික නියැකීම් යන්ත්‍ර (ඩිජිටල්) | 02 | - | - | - | - | 02 |
| 30 | වානේ මැනුම් පටි | 958 | - | - | | - | 958 |
| 31 | පරිගණක සර්වර් | 01 | - | 01 | - | - | 02 |
| 32 | ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතිය | 01 | - | - | - | - | 01 |
| 33 | මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්ස් | 10 | - | - | - | - | 10 |
| 34 | ඩිජිටල් ලෙවල්ස් | 11 | - | - | - | - | 11 |
| 35 | 60 සොල්වන්ට් ප්‍රින්ටර්ස් | 01 | - | - | - | - | 01 |
| 36 | ඩිජිටල් ෆොටෝග්‍රැමටික් වර්ක් ස්ටේෂන් | - | - | 02 | - | - | 02 |
| 37 | අන් මෑන් ඒරියල් වෙහිකල් | - | - | 01 | - | - | 01 |

*ඇමුණුම 08*

# බිම්සවිය වැඩසටහන 2015




*ඇමුණුම 09*


1:10,000 භූගෝලීය ආංකික දත්ත පද්ධතියේ ප්‍රගතිය
යොමුව
1:10,000 පතු වල එකතුව = 1834
චන්ද්‍රිකා ජායාරූප මගින් සකස් කරන ලද ප්‍රදේශ (2015)
චන්ද්‍රිකා ජායාරූප මගින් සකස් කරන ලද ප්‍රදේශ (2008-2009)
චන්ද්‍රිකා ජායාරූප මගින් යාවත්කාලීන වූ ප්‍රදේශ (2008-2009)
JICA වර්ණ ගුවන් ජායාරූප මගින් සකස් කරන ලද ප්‍රදේශ(2010-2011)
ගුවන් ජායාරූප මගින් සකස් කරන ලද ප්‍රදේශ (1994-2007)
මුද්‍රිත සිතියම් අත් පිටපත් මගින් සකස් කරන ලද ප්‍රදේශ (1982-1994)
මුද්‍රිත සිතියම් දත්ත මගින් සකස් කරන ලද ප්‍රදේශ (1982-1994)
පවත්නා දත්ත ලේයර
ප්‍රවාහන
ජල මූලාශ්‍ර
භූමි පරිභෝජනය
ගොඩනැගිලි
ස්ථානීය නාම
පරිපාලන මායිම්
භූමිතිය
දත්ත මාධ්‍ය
Microstation DGN
Shapefiles
Geodatabase
01 02 03 04 05 06 07 08 09 10 11A 11 12 13 14 15 16 17 18 19 20 21 22 23 24 25 26 27 28 29 30 31 32 33 34 35 36 37 38 39 40 41 42 43 44 45 46 47 48 49 50 51 52 53 54 55 56 57 58 59 60 61 62 63 64 65 66 67 68 69 70 71 72 73 74 75 76 77 78 79 80 81 82 83 84 85 86 87 88 89 90 91 92

# පරිපාලන ව්‍යුහය මිනින්දෝරු දෙපාර්තමේන්තුව 2015

ඇමුණුම - 10




ස.ජ. - සර්වේයර් ජනරාල්
අති. ස.ජ. - අතිරේක සර්වේයර් ජනරාල්
ජ්‍යෙ. නි.ස.ජ. - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්
නි.ස.ජ. - නියෝජ්‍ය සර්වේයර් ජනරාල්
ජ්‍යෙ. මි.අ. - ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී
ජ්‍යෙ. කරීකා. - ජ්‍යෙෂ්ඨ කරීකාචාර්ය
මි.අ. - මිනින්දෝරු අධිකාරී
ප්‍ර.කා.ප.නි. - ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරි

සි.නි.නි. - සිතියම් නිෂ්පාදන නිලධාරි
කා.ප.නි. - කාර්මික හා පරිපාලන නිලධාරි
ප.නි. - පරිපාලන නිලධාරි
ගොඩ. හා උප. - ගොඩනැගිලි හා උපකරණ
ප්‍රසම්. හා සැප. - ප්‍රසම්පාදන හා සැපයීම්
ලේ.ක. හා.වෘ.ප්‍ර. - ලේඛණ කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන්
පර්. හා සං. - පර්යේෂණ හා සංවර්ධන
සම්.කළ. - සම්පත් කළමනාකරණ

ඉ.හි.ලි. - ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම
ඉ.තො.ප. - ඉඩම් තොරතුරු පද්ධතිය
තො.තා. - තොරතුරු තාක්‍ෂණ
දූ.ගෝ. - දුරස්ථ ගෝචර
ප්‍රා.කා. - ප්‍රාදේශීය කාර්යාල
භූ.නා. - භූගෝලීය නාම
සි.තා.නි. - සිතියම් තාක්ෂණ නිලධාරි
දූ.ග්‍ර.තා.නි. - දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරි

ඡා.රේ.තා.නි. - ඡායාරේඛණ තාක්ෂණ නිලධාරි
ලි.මු. තා.නි. - ලිතෝ මුද්‍රණ තාක්ෂණ නිලධාරි
පි.ව.මු. තා.නි. - පිඹුරු වර්ණ මුද්‍රණ තාක්ෂණ නිලධාරි
ගු.ඡා.ර.තා.නි. - ගුවන් ඡායාරූප හා රසායනාගාර තාක්ෂණ නිලධාරි
රා.ක.ස. - රාජ්‍ය කළමනාකරණ සහකාර
මැ.උ.ශි. - මැනුම් උපකරණ කාර්මික ශිල්පී
මැ.ස. - මැනුම් ක්ෂේත්‍ර සහායක
දෙ.ත. - දෙපාර්තමේන්තු කම්කරු